මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2021 ජනවාරි - මාර්තු කලාපය

# 70 වෙනි සංවත්සරයට පසු වදනක්



''අතිශය පීඩාකාරී තත්ත්වයන් යටතේ වුවද රටේ ණය සේවාකරණය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම මගින් මෙන්ම විදේශ සංචිත විචක්ෂණශීලී ලෙස කළමනාකරණය මගින් ද ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දී ඇත්තේ එය සත්‍ය වශයෙන්ම මෙරට මූල්‍ය අංශයේ අග්‍රගණ්‍ය ආයතනය වන බවයි.''

-ගෝඨාභය රාජපක්ෂ-
ශ්‍රී ලංකා ජනාධිපති
2020-08-28



''රජයේ සංවර්ධන වැඩ පිළිවෙල යටතේ ශ්‍රී ලංකාව ඉසුරුමත් රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව උත්ප්‍රේරකයක් වනු ඇතැයි මා තුළ දැඩි විශ්වාසයක් ඇත.''

-මහින්ද රාජපක්ෂ''
-ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය-
2020-08-28



''වසර 30 පුරා පැවති සිවිල් යුද්ධයේ මිලෙච්ඡ ප්‍රතිවිපාක සෘජුව අත්විඳීමට මහ බැංකුවට සිදුවිය. කෙසේ වෙතත් විනාශ වූ මිනිස් ජීවිත හා භෞතික සම්පත් හමුවේ වුව ද ඉතාම කෙටි කාලයක් තුළ සිය කටයුතු නැවත ආරම්භ කිරීම ආයතනයක් ලෙස මහ බැංකුව සතුව තිබූ කම්පන වලට ඔරොත්තු දීමේ හැකියාවත්, එහි කාර්ය මණ්ඩලයේ මානසික ශක්තියත් මොනවට නිරූපණය කරන කදිම සාක්ෂි වෙයි.''

-මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්-
-ශ්‍රී ලංකා මහ බැංකු අධිපති-
2020.08.28

# 70 වෙනි සංවත්සරයට සුභපැතුම්

සුපුරුදු සුභ පැතුම් වලට වඩා මඳක් ගැඹුරට ගිය ශාස්ත්‍රීය දිශානතියකට යොමු වූ ප්‍රකාශන තුනකින් උද්ධෘත කරගත් උපුටන තුනක් ඉහතින් දක්වා ඇත. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ 70 වෙනි උපන්දිනය සමරනුවස් කෙරුණු ප්‍රශංසනීය පුවත්පත් අතිරේකයකිනි.

සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන නිලබල ධූරාවලියේ පිරමිඩය මුදුනේ සිට කෙරෙන ප්‍රකාශන තුනක් වශයෙන් ඒවා ගෙන හැර දැක්වීම අසත්‍ය නොවේ. අතිගරු ජනාධිපති, ගරු අගමැති සහ ගරු මහ බැංකු අධිපති යනු සමස්ථ ආර්ථික සංසිද්ධීන් උදෙසා වෙන් කෙරුණු නිලබල ක්‍රමයේ මස්තකය යි. ඒ මගින් 2/3 ක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වෙතටත්, 1/3 ක් මූල්‍ය ප්‍රතිපත්තිය වෙතටත් දෝලනය වීම අහම්බයක් විය නොහැකිය.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේත්, මූල්‍ය ප්‍රතිපත්තියේත් අත් නොහරින වෑයම වී ඇත්තේ දේශයේ දුගී බව අවම කර ගැනීම සඳහා කැපවීම යි. වරෙක මෙම දුගීබව තුරන් කර ගැනීම ගැන දැඩි අවධානය යොමු කරමින් නොබෙල් ත්‍යාග ලාභී බංගලාදේශයේ ග්‍රාමීන් බැංකු නිර්මාතෘ වූ මහාචාර්ය මොහොමඩ් යුනුස් මහතා කළේ මෙවන් ප්‍රකාශයකි. එනම් '' රටේ බහුතරයක්

2 පිටුවට...

ජනතාව මූලික මානව අයිතිවාසිකම් අහිමිව දිළිඳුකමින් පෙළෙන්නේ නම් මගේ උගත්කමින් හා මහාචාර්ය පදවියෙන් ඇති වැඩක් නැතැ''යි යනුවෙනි. එසේ නම් නිලබල ධූරාවලියේ මස්තකයන්ගේ පූර්ණ කැපවීම දියත්විය යුත්තේ ආර්ථිකයේ සාධිය ලක්ෂණ කෙරෙහි වීම, වරප්‍රසාදයක් නොව වගකීමකි. ඒ අනුව හිතකර ජාත්‍යන්තර දේශපාලන හා ආර්ථික පරිසරයකුත්, දේශීය නිෂ්පාදන සාධකයන්ගේ යහපත් වූ ක්‍රියාකාරීත්වය පන ගැන්වීමත් ''හිස ගිනි ගත්තෙකු එගිනි නිවන ලෙස'' කඩිනම් විය යුතුය. එවිට එය විශ්‍රාමික ජන කොටස මෙන්ම වැඩිහිටි ජන කොටසට ද අස්වැසිල්ලක් වනු ඇත.

ගරු අධිපතිතුමනි! ඔබ අද්විතීය ආර්ථික විද්‍යාඥයෙකි. මහාචාර්ය වරයෙකි. අපි ආර්ථික විද්‍යා න්‍යායයන් කොතෙකුත් ඔබෙන් ඉගෙනගෙන ඇත්තෙමු. එසේ ඉගැන්වූ න්‍යායයන් භාවිතා කිරීමට දැන් උදා වී ඇත්තේ කදිම අවස්ථාවකි. රටේ දිළිඳු රේඛාව හා ගිණි සංගුණකය ද, මුදල් සැපයුම හා ඉල්ලුම් සැපයුම් රටාව ද, වර්ධනය, ආර්ථික වර්ධනය හා සංවර්ධනය ද ඉලක්ක කර ගනිමින් ඉල්ලන සන්තුෂ්ඨිය ලබා දීමට ඔබ ඉගැන්වූ න්‍යායයන් භාවිතයට ගන්න. දිළිඳුකම වෙත නෙත යොමන්න. වයස් ගත් වී ඇති ජනගහනයට සවන් දෙන්න. ඔවුන් අතර සිටින විශ්‍රාමිකයන් කෙරෙහි ද කාරුණික වන්න. මහ බැංකු විශ්‍රාමිකයින්ට යළිත් අද්විතීය ගුරුවරයෙකු වන්න.

ඒ සඳහා ඔබට සකලවිධ ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි ඉතිසිතින්ම පතමු.

# මුදල් හා ප්‍රතිපත්ති

සියල්ලටම මූල්‍ය හෙවත් මුදල් මුල් වන බව න්‍යායාත්මකව පෙන්වා දුන්නේ මහාචාර්ය කේන්ස් විසිනි. එය ක්‍රියාත්මක වන්නේ විනිමය මාධ්‍යයක් වශයෙනි. ඒ අනුව මුදල් ඒකකය සමාජය තුළට සේන්ද්‍ර වන්නේ ගෙවීම් පියවීම් පද්ධතිය වඩාත් ක්‍රමවත් හා සුමට කරමිනි. ඒ අනුව සමස්ථ සමාජයේ මුදල් හෙවත් මූල්‍ය ප්‍රතිපත්ති ද්විත්වයකි. එනම් බලය හෙවත් දේශපාලන ක්‍රියාදාමය කේන්ද්‍රකර ගත් රාජ්‍ය ප්‍රතිපත්තිය හා විද්‍යාත්මකව හෙවත් අර්ථශාස්ත්‍රය කේන්ද්‍රකරගත් මූල්‍ය ප්‍රතිපත්තිය වශයෙනි.

1950 අගෝස්තු 28 දා අද්විතීය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රථම අධිපති වූ ශ්‍රීමත් ජෝන් එක්ස්ටර් විද්වතාණන් මෙම මූල්‍ය ප්‍රතිපත්ති ද්විත්වයම පිළිබඳව මනාව දැන සිටි වියතෙකි. ඔහුගේ සුවිශේෂී අවධානය ඉලක්ක ගත කෙරුණේ මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහිම ය.

වර්තමානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථ දෙකකි. එනම්,

1. ආර්ථික හා මිල ස්ථායිතාවය පවත්වා ගැනීම.
2. මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වා ගැනීම.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කර ඇත්තේ බාහිර කම්පනයන්ට හා අභ්‍යන්තර වියවුල් වලට (තොග පිටින්) ශක්තිමත්ව මුහුණ දෙමිනි. වර්තමානයේ එවන් දැවැන්තම අභියෝගයක් වී ඇත්තේ කොවිඩ් 19 වසංගතය යි. ශාස්ත්‍රීයව හා විධිමත්ව ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් දියත් කිරීම මගින් දේශීය ආර්ථිකයේ ස්ථායිතාවය රැකගෙන සිටින බව පෙනෙන්නේ ශ්‍රී ලංකාව තවමත් ඉතියෝපියාවක් හෝ උගන්ඩාවක් නොවී තිබීමෙනි. මේ ශක්තිය පිටුපස සිටින්නේ අන් කිසිවෙක් නොව විද්‍යාත්මකව අර්ථ ශාස්ත්‍රය හා අනෙකුත් ශාස්ත්‍රයක් පරිශීලනය කරනු ලබන කාර්යක්ෂම කාර්ය මණ්ඩලය නිසාවෙනි. අතීතයේ සිටි එවැන්නෝ බොහොමයක් අද විශ්‍රාමිකයන් වන්නාහ.

3 පිටුවට...

# මුදල් හා මහ බැංකුව

මහාචාර්ය කේන්ස්ට අනුව සියල්ලටම මුදල් මුල් වේ. මුදල් යනු ගිවිසුමකට අනුව අප එකිනෙකා එකඟ වූ දෙයකි. එමෙන්ම උද්දමනයෙහි නිර්ණායකය ලෙස මුදල් පරිමාවේ (ම්බඑසඑහ දං එදබැහ) ඇති වැදගත්කම දැඩිව අවධාරණය කළේ මුදල් ආර්ථික විද්‍යාව පිළිබඳව චිකාගෝ ගුරුකුලයේ නියමුවා වන මිල්ටන් ෆ්‍රීඩ්මන් නම් ආර්ථික විද්‍යාඥයා ය. එතුමා වැඩි දුරටත් අවධාරණය කළේ රජයේ මැදිහත්වීම අවම කිරීමේ මූල්‍යමය ක්‍රමෝපායේ වැදගත්කම යි. එවැනි මූල්‍යමය ක්‍රමෝපායයන් විද්‍යාත්මකව හා විධිමත්ව මෙහෙයවීමේ අධිකාරී බලය පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවට යි.

ශ්‍රීමත් ජෝන් එක්ස්ටර් මැතිඳුන් මහ බැංකුවේ ප්‍රථම අධිපතිතුමන් ය. එතුමා උක්ත අධිකාරී බලය මෙහෙය වීමට පටන් ගන්නේ 1950 අංක 49 දරණ මුදල් නීති පනතේ ප්‍රකාරව පැවරුණු නෛතික බලතල හඳුනා ගනිමිනි.

එදා පටන් මුදල් නිකුත් කිරීම, මෙහෙය වීම හා පාලනය කිරීමේ පූර්ණ බලතල 'ආරෝපිතයක්' වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. ඒ අනුව අදාළ නෛතික බලතල ඉවහල් කොට ගනිමින් මේ රටේ ආර්ථික හා මිල ස්ථායිතාවයත්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයක් පවත්වා ගැනීම සඳහා සෑම ඇසිල්ලකම කටයුතු කරමින් පවතී. ආර්ථිකය හා සමාජ ජීවිතය බිඳනොවැටී, රට අයාලේ යන කම්පිත දේශයක් නොවී, බාහිර කම්පනයන්ට ශක්තිමත්ව මුහුණ දෙමින් විරිය පාරමිතාව පුරමින් අල්ලාගෙන සිටින්නේ මූල්‍ය ප්‍රතිපත්තියේ මනා ක්‍රියාකාරිත්වය නිසාය. එම ක්‍රියාදාමය විද්‍යාත්මක ය. එය තේරුම් නොගත් මූර්කානෝ මහ බැංකු කාර්ය මණ්ඩලය දෙස ද්වේශයෙන් බලති. දශක හතක් පමණ මෙම අගනා කාර්යයට කැපවූ ජ්‍යෙෂ්ඨයන් බහුතරයක් අද මෙලොව හැර ගොසිනි. ශේෂයක ගොනු වී සිටින්නේ විශ්‍රාමික සංගමයේ ය. මෙහිදී තර්ක කිරීමට වඩා ඔප්පු කිරීමට වඩාත් යහපත් වූවක් බව පමණක් සටහන් කළ හැකිය. සියළුම (පැරණි හා නූතන) මහ බැංකු විශ්‍රාමිකයෝ ද මනුෂ්‍යයෝ ය. පාරිභෝගිකයෝ ය. වැඩිහිටියෝ ය. අපේක්ෂා දල්වා බලා සිටින්නෝ ය.

# 70 වන සංවත්සරය හා විශ්‍රාමිකයෝ

ප්‍රාථමික භාණ්ඩ හා සේවා හුවමාරු ක්‍රමයෙන් ද මිදී, ඉන්පසුව 1884 වසරේ පටන් දියත් වූ පවුම්, සිලිම් හා පැන්ස භාවිතා කෙරුණු මුදල් කොමසාරිස් හෝ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයෙන් ද මිදී, ස්ථාවර විදේශ විනිමය අනුපාත ක්‍රමෝපායට අනුගතවෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විට දින 25,569 ක් පමණ ගෙවා පෙරට පැමිණ ඇත. එනම් මේ උත්තරීතර ආයතනය වසර හැත්තෑවකින් පරිනත වූ වගයි. එදා මෙදා තුර රටේ ආර්ථිකයේ පෙරගමන්කරු වශයෙන් ඉටු කරන ලද දැවැන්ත කාර්යභාරය වනාහි අන් කිසිවක් නොව බාහිර හා අභ්‍යන්තර කම්පනයන්ට ඔරොත්තු දෙමින් තිරසාර ආර්ථික හයිහත්තිය දරා ගැනීමට කරඋර දීමයි. ඊට එකතු වූ නිර්මල අගය වූයේ කාර්ය මණ්ඩලයේ අමිල දායකත්වය යි.

එදා එසේ රටේ ආර්ථික ශක්තිය තිරසාරව පවත්වා ගනිමින් අදාල ඉලක්කයන් ළඟා කර ගැනීම වෙනුවෙන් සිය විශේෂඥතා දැනුම හා නිපුණතා සම්භාරය වගුරවමින් ඇප කැප වූ මානව සම්පතෙන් බහුතරයක් අද විශ්‍රාමිකයෝ ය. ඉනුදු විශාල පිරිසක් දිවි හැර ගොස් හමාර ය.

ඉතිරි විශ්‍රාමික බහුතරය ඒකරාශී වී සිටින්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ ය. 70 වෙනි සංවත්සරයට ශක්ති පමණකින් වත්මන් පාලනාධිකාරියෙන් ඇරයුම් නො ලැබුවත් සියළුම විශ්‍රාමිකයෝ මහ බැංකුව දෙස බලා සිටින්නේ කවදත් හුරු පුරුදු කෘතඥතාවෙනි. ගෞරව සම්ප්‍රයුක්ත භක්තියෙනි. මහ බැංකුවේ ගෙවී ගිය දින 25,599 න්, දින 21,915 ක් හෝ දින 20,088 ක් මෝ නිරන්තරයෙන්ම ඔවුහු ශ්‍රී ලංකා මහ බැංකු මාතාවගේ ගෞරවය, නම්බුව,

4 පිටුවට...

ශක්තිය, නිරෝගීබව හා ඉලක්ක සපුරා ගැනීම උදෙසා වැය කරන ලද්දෝ ය. කල්පනා කළා යැයි කිසිවෙකු දඟගෙට යවා නැති නිසා අද මහ බැංකු විශ්‍රාමිකයන් නිරතුරුවම කල්පනා කරමින් සිටින්නේ ''හෙට දෙකකට වඩා අද එක වටිනා'' බැවිනි. මෙතෙක් සැමරුම් කරන ලද සියළුම සංවත්සර වලට විශ්‍රාමිකයෝ ද දයාබරව ඇරයුම් ලැබූහ. ඒ ඔවුන් මහ බැංකු අත්තිවාරමේ ශක්තිමත් ප්‍රපංචයන් බව හැමෝම අමතක නොකළ නිසා ය. කමක් නැත. එහෙත් දවසේ නිමාවේ දී අශ්වයාත් අශ්වාරෝහකයාත් පැමිණෙන්නේ (විශ්‍රාමික) ඉස්තාලයට යි.

## අත්තිවාරම හා විශ්‍රාමිකයෝ

නාදයෙන් තොර ගීතයක් නැත. නූලෙන් තොර සළුවක් නැත. විඩිමත් බවින් තොර හැඩයක් නැත. හැඩයකින් තොර සංවිධානයක් නැත. ශක්තිමත් ගල් කුළු, වැලි, යකඩ නැති අත්තිවාරමක් නැත. අත්තිවාරමකින් තොර සොඳුරු නිවහනක් නැත. අවසානයේ දෘශ්‍යමානයෙන් ඈත් කෙරෙන අත්තිවාරම ගැන (නූතනය) සංවේදී නොවේ. එය නොතකා නොසලකා හැරෙන ඉතිහාසයේ රේඛාවක් පමණක් වේ. එය ඉතාමත් කඨෝර වූවකි.

දේශයේ ආර්ථික දේහය කුණු නොවී, ශක්තිමත්ව හා නොබිඳී, නොවැටී පවත්වාගෙන ඒමට ඇපවීමෙන්, කැපවීමෙන් ශාස්ත්‍රීයව හා විද්‍යාත්මකව කටයුතු කළ - කල් පිරුණු - පැරණි කාර්ය මණ්ඩලයෙන් බොහෝමයක් විශ්‍රාමිකයෝ වන්නාහ. ඔවුහු ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ සෙවන යටට වී අපහසුවෙන් ආශ්වාස ප්‍රශ්වාස කරමින් සිටිති. තමාට සිදුවනු දැකීමට නොමැති කිසිවක් අනුනටද සිදු නොකළ ඔවුහු මාතෘ ආයතනයට දොස් පවරන්නන් හට ශාස්ත්‍රීය පිළිතුරු ද සපයති.

මහ බැංකු විශ්‍රාමිකයන් වන ඔවුහු ද ඉපදී සිටින්නේ ජීවත්වීම සඳහා යි. දුර්වල වෙමින් ඇති ක්‍රියශක්තිය තුළ නොමැරී සිටිමි යැයි කියන්නේ ජීවත්වීම නොවේ. මූලික යුතුකම් ඉටු කෙරෙන සමාජයක නම්, අයිතීන් සුරකින්නන්, යුක්ති සහගත ඉල්ලීමක් ඉටුකරන්නන් රජවරු සහ අධිකරණ ද වුවමනා වන්නේ නැත. සාධක සම්පූර්ණ වූ විට මල් පිපෙන්නාසේ ය.

හිරු සඳු ඇවිත් ගිහින් තෑගි කළ
පෙරළී ගිය කැලැන්ඩර් වලින් සින්න වූ
ගෝනියක් ලෙඩ රෝග ගොහොරුවේ එරීගෙන
අහුලාගෙන බෙහෙත් ඇබින්දක්
දැම්මාට කනාටු වූ ගස මුලට
පැන්ෂන්දාට විතරමයි පිපෙන්නේ
යාන්තමින් මල් දෙක තුනක්!!!

-අමරපාල කරසිංහආරච්චි-
(078 5863155)

---

**''කිමපශ්‍යස්ති ස්වාභාවේන**
**සුන්දරං වාපශ්‍ය සුන්දරම්**
**යදේව රෝචතේ යස්මෙ**
**භවේත් තත් තස්‍ය සුන්දරම්''**

''ලෝකයේ සුන්දර හෝ අසුන්දර යැයි ගතහැකි කිසිවක් නොමැත. යම් දෙයක් හෝ යම් කෙනෙකු යමකට රුචි වෙයිද ඒ දෙයම ඔහුට හෝ ඇයට සුන්දර වන්නේමය.''

# පසුගිය කාලය තුළ විධායක කමිටුව ගත් ක්‍රියාමාර්ග බිඳක්...

ලැබුවා වූ 2021 නව වසර ඔබ සැමට නිරෝගීමත් ශුභ නව වසරක් වේවායි අප විධායක කමිටුව ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

2020 වසර කොවිඩ් 19 කොරෝනා වසංගතය නිසා සියලුම දෙනා මහත් අසීරුතාවකට පත්වුන බව අපි කවුරුත් දනිමු. මේ අසීරු තත්ත්වය තුළ වුවද ඔබ වෙනුවෙන් විධායක කමිටුව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව ඔබ දැනුවත් කිරීම සුදුසු යැයි සිතමු. නව අධිපති මහාචාර්ය ඩබ්.ඩී. ලක්ෂ්මන් මහතා හමුවී හමුවී අපේ ගැටලු නිරාකරණය කර ගැනීම යෙදී තිබුණේ පසුගිය වසරේ මාර්තු 18 දින ය. මාර්තු මුලදී කොරෝනා පලමු රැල්ල පැමිණි නිසා එම හමුවීම කල් දැමීමට සිදුවිය. එබැවින් සියලුම කරුණු පාලක පක්ෂය වෙත දැනුම් දෙනු ලැබුවේ විද්‍යුත් තැපෑල මාර්ගයෙනි. ඒවාට අද වනතුරු පිළිතුරු නොලැබීම පිළිබඳව කණගාටුදායක ය.

අපගේ මුල් ඉල්ලීම වුයේ වසර ගණනාවක් කථාබහට ලක් කෙරුණ විශ්‍රාම වැටුප 2015 දක්වා යාවත්කාලීන කිරීමේ ඉල්ලීම යි. පළමුවන කොරෝනා රැල්ල යම්තාක් දුරකට පහව යනවිට අප කළ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන් 2020.09.17 දින අධිපතිතුමා සමග සාකච්ඡාවක් පැවැත්වීමට අවස්ථාවක් ලැබුණි. කාලයකට පසුව අධිපතිතුමා සමඟ පාලක පක්ෂයේ බොහෝ දෙනෙකු එයට සහභාගී වීම නිසා අපේ ගැටලු නිරාකරණය කරගැනීමට හැකිවේ යැයි සිතුවෙමු. නව විධායක කමිටුව අධිපතිතුමාට හඳුන්වා දීමෙන් පසුව මුලින්ම සාකච්ඡාවට බඳුන් වුයේ 2015 ට වැටුප් යාවත්කාලීන කිරීම් ඒ වන විට පවතින තත්ත්වය පැහැදිලිකර ගැනීමයි. ඒ පිළිබඳව මානව සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂිකාව කරුණු දක්වමින් කියා සිටියේ බොහෝ දුරට ඒ පිළිබඳව වැඩ අවසන්කර ඇති බවත් ඒ සඳහා දත්ත ගබඩාවක් (*Data Base*) පවා සකසා ඇති බවත්, අනුමැතිය ලද පසුව ඉක්මනින් ක්‍රියාත්මක කළ හැකි බවත් ය. මෙය අපට ඉතාමත් හොඳ සුභදායක බලාපොරොත්තුවක් විය.

දෙවනුව සාකච්ඡා කළේ මහබැංකු අවමංගල්‍ය සහනාධාර ක්‍රමයේ වර්ථමාන ව්‍යාකුල තත්ත්වය යි. කාර්ය මණ්ඩල සේවා අධ්‍යක්ෂ පැමිණ නොසිටි අතර නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය කියා සිටියේ දැනට ගෙවීම් කිරීමට පොරොත්තු ලේඛනයේ දහඅටක් (18) සිටින බවත් මාසික ලැබීම් අනුව පිළිවෙලින් ගෙවීම් කරන බවත් ය. අවමංගල්‍ය ක්‍රමයේ ඉතිහාසයත් එහි 2007 වන විට තිබූ ප්‍රගතියත් පිළිබඳව කථාකරමින් මා කියා සිටියේ එම අරමුදල පාලනය සම්බන්ධව බැංකු පාලකයන් වගකිව යුතු බවයි. එම අරමුදලේ ඇත්තේ සේවකයන්ගේ විශේෂයෙන් දැනට විශ්‍රාම ගොස් සිටින 90% පමණ වූ අයගේ සාමාජික මුදල් බවයි. ඉහත විනාශය නිසා බැටකන්නට සිදුවී ඇත්තේ අපේ විශ්‍රාමිකයන්ට බවයි. මෙයට පිලියමක් ලෙස අප ගෙනහැර පෑවේ සංගමයේ ව්‍යවස්ථාවට පටහැනිව මහබැංකුව විසින් බාහිර ආයතනයකට බැරකර ඇති මුදල් ලබාදී අපට සහනයක් ලබාදෙන ලෙසයි. මේ සම්බන්ධව මුදල් මණ්ඩල පත්‍රිකාවක් සකස්කර ඇති බවත් එය ලබාදීමට මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන බවත් එහිදී පැවසී ය.

මීලගට වෛද්‍ය ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාදයත් *Cat CDE* කාණ්ඩයේ ගැටලු හා තොරතුරු දැනගැනීම සඳහා දුරකථන ඇමතුම් වලට සවන් නොදීම ඇතුලු සුභසාධනයට අදාල ගැටලු විශාල ප්‍රමාණයක් කථාබහට ලක්විය. මෙහිදී සහකාර අධිපති ධම්මික නානායක්කාර මහතා පවසා සිටියේ විශ්‍රාමිකයන්ගේ මෙම ගැටලු සාකච්ඡා කර විසදාගැනීම සඳහා ඉක්මනින් දිනයක් ලබාදෙන බවයි. නමුත් අද දක්වා සාකච්ඡාවක් හෝ ඒවාට විසදුම් ලබාදීමක් හෝ නොකළේ දෙවන කොරෝනා රැල්ල ආශිර්වාදයක් කරගෙන ය.

පැවති තත්ත්වය තුළ අප ඔබ වෙනුවෙන් ගත් උත්සාහයන් කිහිපයක් ඔබගේ දැනගැනීම සඳහා මෙසේ සටහන් කරමු.

6 පිටුවට...

1. 2020.01.29 දින නැවත වරක් විශ්‍රාමිකයන්ගේ වැටුප් යාවත්කාලීන කිරීම පිළිබඳව, ප්‍රමාදය පිළිබඳව සාකච්ඡා කිරීමට දිනයක් ඉල්ලා සිටියෙමු.

2. 2020.02.24 දින ලිපියකින් 2020.03.18 දින අධිපතිතුමා හමුවීමට පැමිණෙන ලෙස බැංකුව දැනුම් දුන් නමුත් දෙවන කොරෝනා රැල්ල පැමිණීමත් සමඟ බැංකුවට ඇතුලුවීම් නතර කර තිබූ නිසා එයද අවලංගු කරන ලදී.

3. 2020.02.25 දින රජයේ සේවකයන්ට ලබාදුන් යාවත්කාලීන කිරීම හා හිඟ වැටුප් ගෙවීම පොරොන්දු වූ පරිදි අප හට නොලැබීමේ අසාධාරණය දන්වා අග්‍රාමාත්‍ය හා මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට හා ජනාධිපති ලේකම්ට ලිපි දෙකක් අතින්ම ගෙන ගොස් බාරදුන් අතර දෙවනුව සිහිකැඳවීමද කරන ලදී.

4. 2020.20.10 දින අප සංගමයේ වාර්ෂික මහාසභා රැස්වීම පැවැත්වීම රාජගිරිය විදුපියසේ ශ්‍රවනාගාරය ඉල්ලා අධිපතිතුමාට ලිපියත් යොමු කළෙමු. ඒ සඳහා අවසරය ලැබුණ නමුත් කොරෝනා වසංගතය හා පාර්ලිමේන්තු මැතිවරණය 2020.04.25 දින පැවැත්වීමත් නිසා එයට ද අවස්ථාවක් නොලැබුණි.

5. 2020.08.13 මහබැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරිය විසින් යොමු අංක 05/07/003/0005/01 දරණ ලිපිය මගින් ''විශ්‍රාමික වැටුප යාවත්කාලින කිරීමේ ඉල්ලීමට කළමනාකරණ කමිටුව එකඟ නොවූ බවත් ඒ නිසා එය කිසිසේත් ඉටුකළ නොහැකි බවත් දන්වා එවා තිබුණි. ඒ පිළිබඳව ප්‍රාදේශීය විශ්‍රාමික සුහදහමු හරහා සහ ඊමේල් හරහා දැනටමත් ඔබ දැනුවත් කර ඇත. ඉහත තීරණයට විරෝධය දක්වමින් ඒ ගැන සාකච්ඡාවක් සඳහා නැවත ඉල්ලීම් කර ඇත.

6. 2020.09.25 දින නැවත වාර්ෂික මහ සභා රැස්වීම 2020.10.17 දින පැවැත්වීමට අවසර ඉල්ලා ලිපියක් යොමු කළෙමු. ඒ සඳහා අවසර ලැබුණ නමුත් දෙවන කොරෝනා රැල්ල නිසා එයද අවලංගු කිරීමට සිදුවිය. එම නිසා අපගේ 2019 වාර්ෂික වාර්තාව තැපැල් මගින් ඔබ අතට පත්කිරීමට සලස්වන ලදී.

7. 2020.09.01 දින මහබැංකුවට වසර 70 ක් පිරීම නිමිත්තෙන් බැංකු සේවකයන්ට ලබාදී ඇති මාසික වැටුප විශ්‍රාමිකයන්ට ද ලබාදෙන ලෙස ඉල්ලීම් කළෙමු. මෙහිදී වසර 70 ක කාලය තුල සේවය කර දැනට විශ්‍රාමිකව සිටින සේවකයන් දැක්වූ දායකත්වය පෙන්වා දෙන ලදී. උදාහරණ ලෙස 1968 වසරේ මහ බැංකුව තුළ ඇති වූ ගිණිගැනීම හා 1996 ත්‍රස්තවාදි බෝම්බ ප්‍රහාරය වැනි බැංකුවට සිදුවූ විශාල හානිදායක අවස්ථාවලදී බැංකු කටයුතු කඩාවැටීමට නොදී ඉන්ද්‍රබීලයක් සේ නැගිට කැපවීමෙන් කටයුතු කල ආකාරය පෙන්වා දුනිමු. එහෙත් මේ සඳහා විශ්‍රාමිකයන්ට කළ ගෙවීම රු. 10,000/- ක් පමණක් වීම කණගාටු දායක ය.

8. 2020.10.12 දින රැස්වූ වත්මන් විධායක කමිටුව සංගමය ඉදිරියට ගෙනයාමේදීත් බැංකු ගණුදෙනු වලදී පැණ නගින අසීරුතාව මගහැරීම සඳහාත් සාකච්ඡාවට ලක්කරමින් ඒ සඳහා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට අනුව 2019-2020 විධායක කමිටුව 2020-2021 දක්වා ඉදිරියට ගෙනයාමට තීරණය කොට ඒ බව නිල වශයෙන් අධිපති තුමා වෙත දැන්වීමු. මෙම විධායක කමිටුව පත්කිරීමේදී සභාපති ආරියදාස තන්ත්‍රිගේ මහතා ලේකම් ලෙසත් ලේකම් ලෙස කටයුතු කළ ජයලාල් ජයවර්ධන මහතා සභාපති ලෙසත් සෙසු තනතුරු පැවති ආකාරයටම පවත්වාගෙන යාමටත් තීරණය කළෙමු.

9. 2020.11.20 දින අධිපතිතුමා අමතා දැනට රටේ පවතින තතත්ත්වය අයහපත් නිසා 2021 වසර සඳහා ජීවත්වීමේ සහතික (*Live Certificate*) භාරගන්නා දිනය 2020.11.17 දිනෙන් ඔබ්බට දීර්ග කරන ලෙස ඊමේල් මගින් ඉල්ලා සිටින ලදී. එයට නිල වශයෙන් අප හට පිළිතුරක් නොලැබුණත් ඒ සඳහා 2020 අවසානය දක්වා දීර්ග කිරීමට එකඟත්වය ලැබී ඇති බව දැනගන්නට ඇත. එය තවදුරටත් දීර්ග කරනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

7 පිටුවට...

10. සේවයේ නියුතු කිහිප දෙනෙකුට කොවිඩ් වැළඳී ඇති බවට සැකයක් ඇතිවීම මත නිරෝධායනයට හා *PCR* පරීක්ෂණවලට ලක්කර ඇති අතර රාජකාරිය සඳහා පැමිණීම ද සීමාකර ඇත. එබැවින් වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් ප්‍රමාදවීම හා විශ්‍රාම වැටුප් නිවේදන තැපැල් කිරීම ප්‍රමාදවීම ආදිය සිදුවන බව දැනගැනීමට ඇත.

11. කොවිඩ් 19 වෛරසය නිසා බැංකු සේවකයන්ට *PCR* පරීක්ෂණ කිරීම සඳහා ප්‍රතිපූරණය කිරීමට අවස්ථාව ලබාදී ඇත. එම නිසා විශ්‍රාමිකයන්ට ද පෞද්ගලික රෝහල්වලින් *PCR* පරීක්ෂණය කර ගැනීමට ඒ සඳහා විශේෂ කාණ්ඩයකින් (*Special Category*) එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලීම් කර ඇත.

මෙයට,
ලේකම්
-ආරියදාස තන්ත්‍රිගේ-

# 2020 - 2021 වර්ෂ සඳහා ඉදිරි කටයුතු කරගෙන යාම.

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් දිනෙන් දින කල්ගිය තත්ත්වය යටතේ අප වාර්ෂික මහ සභා රැස්වීම 2020 ඔක්. 17 දින රාජගිරිය විදු පියසේ පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර තිබුණද නොසිතූ පරිදි නැවතත් කොවිඩ් ව්‍යාප්තිය උග්‍රවීම නිසා දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදුවිය.

ඒ බව කෙටි පණිවුඩයක් මගින් සාමාජික සාමාජිකාවන් වෙත දන්වා ඔවුන් දැනුවත් කිරීමට ද කටයුතු කළෙමු.

සංගමයේ බැංකු කටයුතුවලදී නිලධාරී මණ්ඩලය වාර්ෂිකව වෙනස් නොවීමත්, ඒ හා සබැඳි නව නිලධාරී මණ්ඩලයේ නම් සඳහන් වාර්ෂික මහ සභා රැස්වීම් වාර්තාව ඔවුන් වෙත ලබා නොදීම හා බැඳුණු ගැටලු ගණනාවක් උද්ගත වූ හෙයින් සංගමයේ අවසාන කමිටු රැස්වීම පැවැත්වූ 2020-10-22 දින ඒ පිළිබඳව සාකච්ඡාට බඳුන්කර ඉදිරි කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා පැවති විධායක කමිටුවේ ඒකච්ඡන්දයෙන් පහත දැක්වෙන වෙනස්කම් සිදුකරන ලදී.

ඒ අනුව ගරු සභාපති ධූරයට ජයලාල් ජයවර්ධන මහතාද ගරු ලේකම් ධූරයට ආරියදාස තන්ත්‍රිගේ මහතාද පත් කල අතර සෙසු නිලධාරීන්ගේ තනතුරුවල වෙනසක් සිදු නොවූ බවද නැවත මහා සභා රැස්වීමක් පවත්වා නව විධායක කමිටුවක් පත්කරගන්නා තෙක් එම නිලයන්හි කටයුතු කරගෙන යාමට ඔවුන් කැමැත්ත ප්‍රකාශ කල බවත් කාරුණිකව දන්වා සිටිමු.

විධායක කමිටුව

**''සූපකාරං. කවිං, වෛද්‍යයං, මන්ත්‍රීනං මංතරවාදීනම්, ස්වාමි නම්, ධනනම්වාපි, මෘත කඤ්චන කෝපයේත්''**

''සූපවේදියා, කවියා, වෙදැදුරා, මන්ත්‍රීවරයා, මන්ත්‍රවේදියා, ස්වාමියා, ධනවතා හා මියගිය අය තරහ කරගැනීම සුදුසු නැත.''

**-වෛදික උපදේශ-**

# සිනා !

## මගේ පුතා හරි හපනා



ගැහැණු හතර දෙනෙක් කලකින් හමුවී තේ බොන ගමන් කතා කරන්නට වුණා. එක් ගැහැරැණියක් ''මගේ පුතා කතෝලික පූජක වරයෙක්. ඒ කමට හරි ආඩම්බරයක්. එයා කොහේ හරි ගියත් ගැහැණු ආසන වලින් නැගිටලා ''පියතුමාණෙනි'' කියා ගෞරව කරනවා.''

දෙවනි ගැහැණිය ''ඒක මොකද් ද? එයා නිකම්ම පූජකවරයෙක් විතරයි. මගේ පුතා අවුරුදු කිහිපයකට කලින් බිෂොප් කෙනෙක් වුණා. එයා කාමරේට ආවම එතැන මිනිසුන් හිස පහත් කර ''උතුමාණෙනි'' කියා ගෞරව කරනවා. මට ඒ ගැන හරි ආඩම්බරයි.''

මේ කතාව අසා ඊර්ෂ්‍යාවෙන් යුතුව තෙවැනි ගැහැණිය ''ඒක මොකක් ද? එයා නිකම්ම නිකං බිෂොප් කෙනෙක් විතරයි නේ ද? මගේ පුතා කාදිනල් කෙනෙක්. ඔහු යම් තැනකට ගියාම මිනිසුන් දණ නවලා පහත්වෙලා ''මහෝත්තමයාණෙනි මහෝත්තමයාණෙනි'' කියා ගෞරව කරනවා. මට හරිම ආඩම්බරයි.''

ගැහැණු තුන්දෙනා හතරවැනි ගැහැණිය දිහා බැලුවා. ඇය හිස පහත් කරගෙන තේ බොනවා. ''මොකද කියන්නේ? කොහොමද ඔයාගේ පුතා?'' කියා විමසුවා. එයා කදිම පුතෙක්. ඒයා පූජකවරයෙක් වත්, බිෂොප් කෙනෙක්වත්, කාදිනල් කෙනෙක්වත් නෙවෙයි. මගේ පුතා අඩි 06 අඟල් 04 ක් උස යි. ලක්ෂපතියෙක්. ජාතික පාපන්දු කණ්ඩායම් සෙල්ලම් කරනවා. එයා කාමරයට ඇතුළු වුණාම එහි සිටින ගැහැණු එයා වටකරගෙන *"Oh my god oh my god"* (හපොයි මගේ දෙවියනේ) කියා කෑ ගසනවා.''

උපුටා ගැනීම :''සිනාසෙන බුදුහාමුදුරුවෝ'' කෘතිය
කර්තෘ : සමරසිංහ ගුණසේකර

-විමලා ධනපාල මිය-
(3108)

---

සැමියා :- කුසුම් මේ කොරෝනා දවස්වල තියෙන ලෙඩ වැඩිවෙලා හදිසියේ මං මලොත් ඔයා මොකද කරන්නේ?
බිරිඳ :- මමද ඔයා නැතිව මේ ගෙදර ඉන්නේ කොහොමද? ගෙවල් දොරවල් විකුණලා දාලා අපේ පොඩි නංගි ලඟට යනවා. ඒක නෙමෙයි මං මලොත් ඔයා මොකද කරන්නේ?
සැමියා :- මාත් ඔයාලාගේ පොඩි නංගී ලඟට යනවා.
බිරිඳ :- ඈහ්

---

ඉංග්‍රීසි ගුරුතුමිය : ළමයි අපි අද අම්මගේ නම ඉංග්‍රීසියෙන් ලියන්න යන්නේ. මගේ ටියුෂන් පංතියටත් එන නිසා ඔක්කොම ලියන්න පුලුවන් වෙන්න ඕනා
ටික වේලාවකට පසු
ගුරුතුමියට : සුමල් ඔයා ලියලා ඉවර නම් ගේන්න.
සුමල් : ආ ටීචර්
ගුරුතුමිය : මොකක්ද ලමයෝ මේ Expire perera කියලා ලියලා තියෙන්නේ?
සුමල් : අපේ අම්මගේ නම කල්පනී පෙරේරා. ඇයි වැරදිද ටීචර්?

ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා හා ලෝක බැංකු සභාපතිවරයා මහබඹු හමුවීමට ගියේ තම තමන්ගේ රටවල පවතින කොවිඩ් උවදුර හේතුවෙන් ආර්ථික උද්ධමනය අඩුකිරීමට උපදේශයක් ලබා ගැනීමේ පරමාර්ථයෙනි.

ලෝක බැංකු සභාපති :-මහ බඹානෙනි, ඇමෙරිකාවට බලපා තිබෙන ප්‍රශ්න හා කොරෝනා වසංගතය අවසන් වී යහපත් තත්ත්වයක් ඇතිවීමට කොපමණ කල් ගතවේ ද?
මහබඹා :- තව අවු. 20 න් ලෝක පොලිස්කාරයා නීතිගරුක වී සාධාරණ සමාජයක් බිහි වෙනවා. සාමය උදාකරන්න පෙරමුණ ගන්නවා.

මෙය ඇසූ ලෝක බැංකු සභාපතිවරයා මහ හඬින් හඬන්නට ගත්තේය. හැඬීමට හේතුව කුමක්දැයි ප්‍රශ්න කල මහබඹාට ඔහු කීවේ රට යහපත් තත්ත්වයකට පත්වන කාලයක එය දැකීමට තරම් කාලයක් තමාට ජීවත්වීමට නොහැකිවිම ගැන සිතා කනගාටුවට පත්වී හැඬූ බවයි.

ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා ද තමන්ගේ රට සියලු ප්‍රශ්නවලින්මිදි මූල්‍ය තත්ත්වය යහපත් අතට හැරී රට සුඛිත මුදිත වන වකවානුව කෙදිනකදැයි මබඹුගෙන් විමසීය.

එයට සවන් දුන් මහබඹා මහ හඬින් හඬන්නට පටන් ගත්තේය.

මහබැංකු අධිපතිවරයා කළබලයට පත්ව මහබඹා අඬන්නට හේතු විමසූයේ කුතුහලයෙනි. ඔබගේ රටේ ප්‍රශ්න විසදෙන දවස කියන්න බෑ. එච්චර කල් මටත් ජීවත් වෙන්න ලැබෙන්නේ නෑ. ඒ වෙනකොට මාත් මැරිලා යනුවෙන් මහබඹු පිළිතුරු දුන්නේ කඳුලු පෙරමිනි.....

-ජගත් කාරියවසම්-
(0779507184)

---

බිරිඳ :- මා එක්ක පාරේ යනකොට දකින දකින ගෑණු දිහා හැරි හැරි බලන්නේ මොකද ඕයි?
සැමියා :- අනේ මෝඩියේ මම බලන්නේ ඒ ගෑනුන්ට වඩා මගේ වයිෆ් කොච්චර ලස්සන ද කියලා. ඒකවත් තෙරෙන්නේ නැහැනේ.

---

# වාර විභාගය අවසන් වූ පසු

1 මිතුරා :- උඹ හරි පල් මිනිහෙක් බං. මන් දෙවැනි ප්‍රශ්නෙට උත්තරේ ඇහුවම උඹ ලියුවේ නෑ කීවට මං දැක්කා උඹ ලියලා තියෙනවා.

2 මිතුරා :- කව්ද බං බොරු කිව්වේ?

1 මිතුරා :- ඇයි උඹ කිව්වේ නැද්ද ලියුවේ නෑ කියලා.

2 මිතුරා :- ඉතින් බොරුවක් ද? ලියුවේ නෑ කියලා කීවනේ.

1 මිතුරා :- උඹලා යන පාරකවත් යන්න හොඳ නෑ බං.

2 මිතුරා :- හරි. දෙවැනි ප්‍රශ්නෙට අහලා තිබුණේ මොකක් ද? කලියුගය පොත ලියුවේ මුනිදාස කුමාරතුංග මහත්තයා ද කියලනේ.

1 මිතුරා :- හරි හරි කියපන්කෝ.

2 මිතුරා :- බූරුවෝ මම කීවේ ඒකට උත්තරේ.

-ජගත් සොයිසා-

-ගාල්ල-
(0714424993)

# පෙම්වතියට ලියූ කවි

සමුගෙන ඔබෙන් මා අගනුවරට ආවේ
අත්වූ නිසාවෙනි මහබැංකුවේ සේවේ
එනමුදු කාන්සිය බැලු බැලු අත පෑවේ
මොකටද සොඳුරියේ මෙහි ඔබ නැති ජීවේ

සැන්දෑ අඳුර සහ බෝඩිම වෙත ආවා
මුළු රැය නිදිවරා නෙත කඳුලැලි බීවා
එළඹෙන පොහොය දින බොදු බැතියෙන් නාවා
මතකයි එදිනවත් සිල් ගන්නැයි කීවා

මෙවර වෙසක් පොහොයට මම කැළණි යමි
තෙල්, මල්, සුවඳ ගෙන නමැදිමි සුගත හිමි
සඳහම් අමා ජලයෙන් ගත සිතම තෙමී
මා කරගත් පිනින් කොටසක් ඔබට දෙමි

මා එවි වෙසක් පත ඔබ හට ලැබුනාද
එහි ලියැවුණු කවිය රහසින් බැලුවාද
දෙතැනක සිට නමැද සම්බුදු සිරිපාද
ශක්තිය ලබාගමු එක්වන්නට යෝද

ඔබ මා නිසා දැන් පාසල් නොයන වග
දැරියක් පැවසුවා හමුවූ අතර මග
පාඩම් කළොත් වෙහෙසී ඒ ගමනෙ අග
තරණය කළ හැකිය සැතපුම් සියයේ දිග

ඔබ යෙහෙළියන් සමගින් කරනා දඟ
දුටුවා නිතර රිසින් මේ බලයෙ ළග
ස, රි, ග, ම කාමරය වෙත යන අතර මග
ඔබ හමුවුණත් දුටුවේ මා නොදුටු වග

සඳ ඇති රැයක නිල් තණ ඕවිටි ඔස්සේ
අතිනත් පටලවා හිරිපොද මල් වැස්සේ
අපි හමුවූයේ බාදක හිරිහැර අස්සේ
සෙවනැල්ලක් වගේ එමි ඔබ පසු පස්සේ

අත්තටු මවාගෙන නිල්වන් ගගන ගැබ
පියඹා එන්න දැයි මා අවසරය ලැබ
ලංවන දිනය එනතුරු ඒ මොහො සුබ
රැයකට දෙතුන් වර සිහිනෙන් දකිමි ඔබ

ජීවිත ඔරුව පැදයන්නට සයුර දිගේ
ඔබ හබලක් උනා මගේ හදවතට හැගේ
දොළබඬ කුසුම මිහිරාවිය රැජින මගේ
ඔබ නැති සිදාදිය මට නරකාදියක් වගේ

නැලවෙන්නට ලබා පෙම් ලොව ජය කේලී
කරගන්නම් සොදුර ඔබ මගෙ මන මාලී
කියවනවා නොවෙයි උමතුව පල් හෑලි
දැන්වත් සිනාසෙනු මැන මගෙ සීලි

බැහැ මට තවත් වෙහෙසී නිදි මරන්නට
අවසර සොදුර මෙය අවසන් කරන්නට
දුරකථනයක් ඇති තැනකට ඇවිත් මට
අමතනු මැනවි ආදරයෙන් සවස හෙට

-ක්‍රිස්ටි ගුණසේකර-
0718554263

# අත්ෆෝනයක ශාපය
## සැබෑ කථාවකි

යන්නේ 'බ්‍රවුන්ස්' රෝහලට
දොස්තර එන්නේ හතරට
වැහුනා ගේට්ටුව එකපාරට
බැරි හැඩයි යන්ට වේලාවට

බලාහිටියා ටිකක් වේලාවක්
නෑ කෝච්චියක් එන පාටක්
යන එන අය හදිසි ගමනක්
ඒවි පාරට නොගෙන අවදානමක්

වැටුණා රතු පාට එළියක්
ඩිං ඩිං වැදුනා බෙල් එකක්
ගතවුණා තවත් කාලයක්
වගෙයි යම්කිසි අවුලක්

ඈත එනවා කෝච්චිය
රියදුරු නලාව හැඬවිය
සැවොම පාරෙන් ඉවත්විය
කවුද ඒ ආ තරුණිය

සවණාත ෆෝනයක් රැදවිණි
ඇයට කිසිවක් නොඇසුණි
දෙපස සිටි අයට කෑගැසුණි
ඇය කෝච්චියේ හැප්පුණි

සිරුර ඇගේ දෙකඩවිය
ගැලූ රුධිරය අපමණය
දුටු දෙනෙත් කඳුළු ගැන්විය
අහෝ අත් ෆෝනයක ශාපය

-ගෝමි- (624)
0112926374

# අපේ පුංචි සරතල්ලු ළඟට
## ආවම මේ සින්දුව කියලා දෙමු

අත්තම්මා ගෙදර ඇවිල්ලා
අපිට රස කෑම ගෙනල්ලා//

අත්තම්මගේ කෑම හරි රසයි
එන්න කන්න කෑම හරි රසයි

අත්තම්මා ළඟ කතන්දර ගොඩයි
රජකාලේ කතන්දර රසයි

අත්තම්මා ගෙදර ඇවිල්ලා
අපිට රස කෑම ගෙනල්ලා//

අත්තම්මා අපේ හරි හොඳයි
කියල දුන්න කතන්දර ගොඩයි

රටට තොටට වැඩ ගොඩයි
අපෙ සීයා වීරයෙක් තමයි

ඇළ කපලා හරවාලා
ගොඩමඩ ගොවිතැන් කරලා

අපෙ සීයා රජෙක් තමයි
අත්තම්මා රජ බිසව තමයි

අත්තම්මා ගෙදර ඇවිල්ලා
අපිට රස කෑම ගෙනල්ලා//

සුමිත්‍රා තිලකරත්න : 0714985235

## පිං පැමිණවීමේ උත්සවයේ ඡායාරූප කිහිපයක්...







# CENTRAL BANK BOMBING 25TH ANNIVERSARY

## With bowed heads we remember and sign

31st January 1996.
an unforgettable date
Central Bank employees.
as usual, at work
The morning blasts
across their fate
To kill, maim and blind
their future.

Remembering now.
Myriad memories of aches
and soul searching.
Ethnic politics splintering
our lives.
Will they ever learn
fair play?
Dirty politics is the name
of the game.

With bowed heads we
remember and sign,
Our lives shaken,
for the lost souls
We cry.

Central Bank Pensioner
**Ms. Eileen Dane**
[The Sunday Times Plus]
31st January 2021

# බුදු දහම සහ අනිත්‍යය

ශරීරය දිරාපත් වීම, භෞතික වස්තූන් වන ගස්වැල්, පුටු මේස ආදිය දිරාපත් වීම හෝ වෙනස්වීම අනිත්‍ය ලෙස බුදුරජාණන් වහන්සේ වදාළේ නැත. ආලාර කාලාම, උද්දකරාම පුත්‍ර, මක්ඛලී ගෝසාල, නිගන්ඨනාථපුත්ත වැනි ශාස්තෘවරයින් ද මෙම භෞතික වස්තූන්ගේ වෙනස්වීම දැන සිටියහ. මෙවැනි දේවල අනිත්‍ය ගැන බුදුරජාණන් වහන්සේ දේශනා නොකරන ලදී. එසේනම්, බුදු දහමේ අනිත්‍ය කුමක්ද ? යනු විමසා බලමු.

ඇස (චක්ඛු), කන (සෝත), නාසය (ඝාන), දිව (ජිව්හා), ශරීරය (කය), සිත (මන) නැමති සළායතන මගින් අරමුණු ලබා ගනී. ඇසට රූප රූපය ද, කනට ශබ්ද රූපය ද, නාසයට ගන්ධ රූපය ද, දිවට රස රූපය ද, ශරීරයට පොට්ටබ්බ (ස්පර්ශ) රූපය ද, සිතට සිතුවිලි ද අරමුණු වෙති.

ඇසට එන අරමුණු චක්ඛු විඤ්ඤාණ ලෙස ද, කනට එන අරමුණු සෝත විඤ්ඤාණ ලෙස ද, නාසයට එන අරමුණු ඝාන විඤ්ඤාණ ලෙස ද, දිවට එන අරමුණු ජිව්හා විඤ්ඤාණ ලෙස ද, ශරීරයට එන අරමුණු කාය විඤ්ඤාණ ලෙස ද, සිතට එන සිතුවිලි මනෝ විඤ්ඤාණ ලෙස ද හඳුන්වා ඇත.

ඉහත සඳහන් සළායතන මගින් හට ගන්නා අරමුණු නිසා රූප, වේදනා, සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාණ යන පංචස්කන්ධය හට ගනී. තවද මේවා රූප ස්කන්ධය, වේදනා ස්කන්ධය, සඤ්ඤා ස්කන්ධය, සංඛාර ස්කන්ධය, විඤ්ඤාණ ස්කන්ධය යන පංචස්කන්ධය ලෙස හඳුන්වා ඇත. මෙම පංචස්කන්ධය බුදු දහමේ එන වැදගත් ධර්මතාවයකි.

ස්කන්ධයන්ගේ හට ගැනීම සිදුවන්නේ එක් එක් ආයතනයන්ට හට ගන්නා හේතු කිහිපයක් නිසාවේ. උදාහරණ ලෙස : ඇසේ ප්‍රසාද රූපයත්, ඉදිරියෙන් ඇති ඝන රූපය (පඨවි, ආපෝ, තේජෝ, වායෝ) ස්වභාවය (මහාභූත) සහ ආලෝකය යන හේතූන් නිසා රූප රූපය හමුවේ. (රූප ස්කන්ධය - පෙනීම ඇතිවේ.) ශබ්ද රූපය ඇති වන්නේ කනේ ප්‍රසාද රූපයත් ශබ්දයත් හේතු කොටගෙන ශබ්ද රූපය හටගනී. (ඇසීම ඇතිවේ) නාසයේ ප්‍රසාද රූපයත් බාහිරෙන් එන ගඳ සුවඳත් හේතු කොටගෙන ගන්ධ රූපය හටගනී. දිවේ ප්‍රසාද රූපයත් බාහිරෙන් එන රස හේතු කොටගෙන රස රූපය හටගනී. ශරීරයේ කාය ප්‍රසාදයත් පොට්ඨබ්බයත් (ස්පර්ශ) හේතු කොටගෙන පොට්ඨබ්බ රූපය හටගනී. විඤ්ඤාණය මගින් මෙම ස්කන්ධයන් සකසනු ලබයි.

''චක්ඛුං පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සෝ'' ඇසත් රූපයත් නිසා විඤ්ඤාණය උපදින්නේ ය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාණ යන පංචස්කන්ධය හට ගන්නේ සළායතන හේතුකොට ගෙනය. පංචස්කන්ධයේ දැඩි ලෙස ඇලීම හෝ ගැටීම උපාදානය වේ. ඒ නිසා මෙයට පංචා උපාදානස්කන්ධය ලෙස දක්වයි. දැඩි ලෙස ඇලීම හෝ ගැටීම (උපාදාන වීම) ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල් සිත් උපදී. ''සංඛිත්තේන පංච උපාදානස්කන්ධා දුක්ඛා''

බුදු දහමට අනුව සිතක් පවතින්නේ චිත්තක්ෂණය ක කාලයක් පමණි. ක්ෂණයක් යනු ඇසිපිය හෙළන වේගය මෙන් ලක්ෂ වාරයකි. තවද, එකවිට හට ගන්නේ එක සිතක් පමණි. සිත් දෙකක් එකවර හට නොගනී. සිතක් ඇති වී නිරෝධ වූ පසු තව සිතක් ඇතිවේ. වේගය නිසා අපට සිත්වල ඇතිවන සත්‍යය වටහා ගැනීම අපහසු වේ. උදාහරණයක් ලෙස ගිනි බෝලයක් වේගයෙන් කරකවන විට ගිනි වළල්ලක් මෙනි. සත්‍ය වන්නේ එහි ඇත්තේ ගිනි බෝලයක් පමණි. තවද, මිරිගුවක වතුර තිබෙන බව ඈත සිට දුටුවත් ළඟට ගිය පසු එහි වතුර නොමැති බව දැන ගනී. තවද, විදුලි බුබුළක් (බල්බයක්) තත්පරයකට හැට වාරයක් නිවි නිවි පත්තු වෙනවා. එහෙත් අපට පෙනෙන්නේ දිගටම විදුලි බුබුළ දැල්වෙන බවය. එසේ නම්, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන චෛතසික ක්ෂණයකින් ඇති වී ක්ෂණයකින් නැති වේ.

බුදුරජාණන් වහන්සේ රූපය පෙන පිඩක් ලෙස ද, වේදනාව ජල බිංදුවක් ලෙස ද, සඤ්ඤාව මිරිගුවක් ලෙස ද, සංඛාර කෙසෙල් කඳක් ලෙස ද, විඤ්ඤාණය මායාවක් ලෙස ද උදාහරණ ලෙස පෙන්වා ඇත. මෙම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණය මගින් සකස් කරන ලද චෛතසිකයෝ ය. එසේ පෙනෙන සංඛාර සියල්ලම මායාවකි. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන එක් එක් සිත ඇති වී ක්ෂණයකින් නැති වී යයි. එසේ හේතු ඇතිවිට ඵලය ඇති වීමත්, හේතු නැතිවිට ඵලය නැතිවන ස්වභාවත් ඇත.

13 පිටුවට...

ඇස නිසා රූපයවත්, රූපය නිසා ඇසවත් ඇති නොවේ. විඤ්ඤාණය විසින් සකස් කරන ලද මායාවකි. ඇස රූපය යන හේතු ප්‍රත්‍යයන්ගෙන් පණවන ලද්දකි. මෙහි නිත්‍ය ස්වභාවයක් නැත. වේදනාව :- සුඛ වේදනා, දුක්ඛ වේදනා, අධුක්ඛම දුක්ඛ වේදනාව (උපේක්‍ෂා) තුන්වැදෑරුම් වේ. සඤ්ඤා යනු හඳුනා ගැනීමයි. සංඛාර ද විඤ්ඤාණය විසින්, සළායතන මගින් ගන්නා වූ අරමුණු සකස් කරදෙන චෛතසිකයක් ය. ඉහත සඳහන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇති උපමා අනුව, මේ සියල්ල අතින් අල්ලා ගත නොහැකි, ආධ්‍යාත්මිකව සිතෙහි ඇති වන්නා වූ චෛතසිකයන් වේ.

ඉහත සඳහන් කළ පංච උපාදානස්කන්ධ : මම, මම මගේ, මගේ ආත්මය ලෙස ගැනීම සක්ඛාය දිට්ඨියයි. එසේනම්, සක්ඛාය දිට්ඨිය දුරු කිරීමට නම්, රූපය : මම, මම මගේ, මගේ ආත්මය ලෙස නොගැනීම. වේදනාව : මම, මම මගේ, මගේ ආත්මය ලෙස නොගැනීම සඤ්ඤාව : මම, මම මගේ, මගේ ආත්මය ලෙස නොගැනීම. සංඛාර ද මම, මම මගේ, මගේ ආත්මය ලෙස නොගැනීම. විඤ්ඤාණය මම, මම මගේ, මගේ ආත්මය ලෙස නොගැනීම නිසා සක්ඛාය දිට්ඨිය නිරෝධ වේ. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපය ආත්මය වශයෙන් නොදකියි. ආත්මය රූපය වශයෙන් නොදකයි. රූපය තුළ ආත්මය පිහිටා ඇතැයි නොගනියි. ආත්මය තුළ රූපය පිහිටා ඇතැයි නොගනියි. මෙය සක්ඛායදිට්ඨි නිරෝධයයි. සැප වේදනාව සිහි නුවණින් මෙනෙහි කිරීම තුළින් රාගානුසය දුරුවේ. දුක්ඛ වේදනාව සිහි නුවණින් මෙනෙහි කිරීම තුළින් පටිගානුසය දුරුවේ. උපේක්‍ෂා වේදනාව සිහි නුවණින් මෙනෙහි කිරීම තුළින් අවිජ්ජානුසය දුරුවේ. (චූල්ල වේදල්ල සූත්‍රය)

සක්ඛායදිට්ඨිය ප්‍රහාණය කිරීම නිසා විචිකිච්චා සහ සීලබ්බත පරාමාස යන සංයෝජන දෙක ද ප්‍රහාණය වී යයි. එවිට සෝවාන් භාවයට පත්වීමට හැකිවේ. එහෙත් මෙයට බාධා වන්නේ පංචනීවරණ ධර්මයන් ය. පංචනීවරණ යනු කාමච්ඡන්ද, ව්‍යාපාද, උද්දච්ච කුක්කුච්ච, ථිනමිද්ධය, විචිකිච්චා යන නීවරණයෝ ය.

පිං කිරීම අපට ධර්ම මාර්ගය දැන ගැනීම පිණිස හේතුවේ. පිංකම් කිරීම පුඤ්ඤාභි සංඛාරයයි ද, පව්කම් අපුඤ්ඤාභි සංඛාරයයි ද, ධ්‍යානලාභීන් විසින් කරන කර්ම ආනේඤ්ඤාභි සංඛාර යනුවෙන් ද හඳුන්වයි. පුඤ්ඤාභි සංඛාරයෙන් පරලොව යෑම නිසා දිව්‍යලෝක 06 හෝ මනුෂ්‍ය ලෝකයේ උප්පත්තිය ලැබිය හැකිය. අපුඤ්ඤාභි සංඛාරයෙන් පරලොව යෑම හේතු කොටගෙන සතර අපායේ උප්පත්ති ලැබිය හැකිවේ. ආනේඤ්ඤාභි සංඛාර එනම්, ධ්‍යානයෙන් පරලොව යෑම නිසා රූපාවචර සහ අරූපාවචර බ්‍රහ්ම ලෝකවල උප්පත්තිය ලැබිය හැකිය. එසේනම්, සංඛාර සියල්ල ම භවගාමී වේ. සසරේ සැරි සැරීමට සිදුවේ. බුදුන් වහන්සේ ''සබ්බේ සංඛාරා අනිච්ඡා - සබ්බේ සංඛාරා දුක්ඛා'' ලෙස වදාළේ ය. සියලු සංස්කාර අනිත්‍ය බවත්, සියලු සංස්කාර දුක බවත් හැඟේ.

භවගාමීත්වය නතර කිරීමට නම් කර්මක්ෂය කිරීමේ කර්මය වැඩිය යුතුය. රහතන් වහන්සේලා හා බුදුරජාණන් වහන්සේලාට ''පුඤ්ඤ පාප පාහිනස්ස'', පින්පව් දෙකම ප්‍රහාණය කළ ඇත්තෝ වෙති. අපි මෙය උදාහරණය ගෙන සළකා බලමු. පහනක දැල්ල තිරය සහ තෙල් නිසා දැල්වේ. පහන තව තවත් තෙල් දැමීමෙන් එය නොනිමි දැල්වේ. එහෙත් එයට තෙල් නොදැමූ විට ටිකෙන් ටික දැල්ල නිවී යයි. රතන සූත්‍රයේ එන පහත සඳහන් ගාථා කාණ්ඩය බලන්න. ''ඛීණං පුරාණං නවංනත්ථි සම්භවං විරත්ත චිත්තා ආයිතිකේ භවස්මිං ......'' මෙම ගාථාවේ අර්ථය වන්නේ, යම් කෙනෙකුගේ පුරාණ කර්ම ගෙවී ගියේ ද, පහළවන අලුත් කර්මයකුත් නැත්ද, මතු භවයෙහි නොඇලුණු සිත් ඇති නැවත ඉපදීම විනාශ කර ඇත්තා වූ ඒ නුවණැති රහතන් වහන්සේලා පහනක් යම් සේ නිවීමට පත්වේද ඒ අයුරින් පිරිනිවනට පත්වෙති. මෙය සංඝ රත්නයේ උතුම් ගුණයකි. ඒ සත්‍යය බලයෙන් සෙතක් වේවා ! ඉන් අදහස් වන්නේ පුරාණ කර්ම ක්ෂය වීමට සළස්වන ලෙස සහ තව තවත් කර්ම රැස් නොකරන ලෙසය. ''පුඤ්ඤ පාප පාහීණස්ස''

වර්තමාන උපාදානස්කන්ධයන් අනාගත ඵලයකට හේතු ඉතිරි කර අවසන් කරයි නම්, එය ''අවශේෂ නිරෝධය'' සේ දක්වයි. මෙහිදී පංච ස්කන්ධය නිත්‍ය, සුඛ ආත්ම ලෙස ගැනීම භවගාමී වේ. ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල් සිත් හටගනී. එහෙත් වර්තමාන උපාදානස්කන්ධයන් අනාගත ඵලයට හේතු ඉතිරි නොකර අවසන් කරයි නම්, එය ''නිරවශේෂ නිරෝධය'' යි. පංචස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස ගැනේ. එමනිසා අලෝභ, අද්වේශ වැනි කුසල් සිත් ඇතිවේ. බුදුන් වහන්සේ ''සබ්බේ සංඛාරා අනිච්ඡා - සබ්බේ සංඛාරා දුක්ඛා'' දැක්වූයේ මේ නිසාය.

එසේනම්, බුදු දහමේ අනිත්‍ය ඇත්තේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධය තුළය.

14 පිටුවට...

රාගක්ඛය නිබ්බානං
දෝසක්ඛය නිබ්බානං
මෝහක්ඛය නිබ්බානං   ලෙස බුදුරජාණන් වහන්සේ වදාළහ.

**ජයලාල් ජයවර්ධන**

**ආශ්‍රිත ධර්ම දේශනා :-**
පූජ්‍ය මීමුරේ ධම්මාවංශ හිමි, පූජ්‍ය දික්කුඹුරේ සුභීත හිමි, පූජ්‍ය වළස්මුල්ලේ ගුණරතන හිමි, පූජ්‍ය කිරුළපනේ ධර්මවිජය හිමි, පූජ්‍ය රතුපස්කැටියේ විමුක්තිරතන හිමි,

**ආශ්‍රිත සූත්‍ර දේශනා :-**
අනන්ත ලක්ඛණ සූත්‍රය, චූල්ල වේදල්ල සූත්‍රය, මහා සතර සතිපට්ඨාන සූත්‍රය, සබ්බාසව සූත්‍රය සහ සම්මා දිට්ඨි සූත්‍රය

# කෙටිකථාව

සුභ උපන් දිනයක් වේවා!

සඳ කිරණින් සඳළු තල වලට ආලෝකය ලැබෙද්දී, කුඩා පැල්පත් වලටද එම ආලෝකය ලැබෙන්නේ ස්වභාව ධර්මය නිසයි. සියළු දෙනාට එම ධර්මය එක නිසාවෙනි. සියළු දෙනාට එම ධර්මය එකසේ සළකන නිසයි. එහෙත් සංස්කෘතික විනාශය නිසා බොහෝ විට ස්වභාව ධර්මයට පිටුපාන මිනිසුන් බහුලයි.

ස්වභාව ධර්මයට ආදරය නොකරන දරුවන් මෙලොව බිහිවී ඇත්තේ දෛවයේ සරදමක් ලෙසිනි. විමලට මේ රාත්‍රිය විශේෂ රාත්‍රියක් විය. පුතා සමග ජීවත් වූ විමලා එදින උදෑසන සිටම වේලාව බලමින් රාත්‍රිය උදාවන තුරු බලා සිටියේ නොඉවසිල්ලෙනි. අඳුර වැටෙත්ම මේ මව පුතාගෙන වේලාව අසන්නට විය. එසේ සිදුවූයේ ඔරලෝසුවේ වේලාව නතර වී ඇති බැවිනි. වේලාව රාත්‍රී 9ට පමණ විය. විමලා තම පුතාගෙන ''පුතේ දැන් වේලාව කීය ද?'' කියා ඇසුවා ය. ''ඇයි අම්මේ වේලාව මොකට ද'' කියා පුතා ඇසුවේ ය. ''නෑ පුතේ ඔරලෝසුවේ වේලාව නතර වෙලා ඒකයි ඇසුවේ.'' ''ආ වේලාව දැන් රාත්‍රි 9 යි.'' කියා පුතා කීවේය. තව පැයකින් පමණ විමලා තම පුතාගෙන් ''පුතේ වැඩක් ද?'' ''ඔව් අම්මා මම කොම්පියුටරේ වැඩක්'' කියා කීවේය. ''අනේ පුතේ මට තරහා නැතිව වෙලාව කීයද කියලා කියන්න'' කෝපාවිශ්ඨ වූ පුතා අම්මාගේ සිත කළකිරෙන විදියට බැණ වදින්නට වූයේ ය. අම්මා පුතාගේ සැබෑ ස්වරූපය දැක්කේ අද තමයි කියා සිතුවා ය. ''අම්මට පිස්සු ද? මොන කරදයක් ද? මේ පිස්සු හැදිල ද? අම්මට '' කියා ඇසුවේ ය. ''ගිහින් පව් නොදී නිදාගන්න'' යැයි කීවේය. අම්මාගේ සිත සසල විය. ''අනේ දෙවියනේ මේ ළමයා සමඟ මා තනිකරලා මගේ සැමියා යන්නට ගියා.'' ''අනේ මාවත් අරගෙන ගියා නම් සහන් පුතාගේ රෙස්පොට් එක බලන්නේ නැහැනේ'' කියා විමලා සිතුවා ය. ''අනේ සහන් පුතේ උඹේ අප්පච්චි මට කවදාවත් ඔහොම රවලා බැනලා නෑ.'' කියා මව කීවාය. ''අනේ මම මේ දරුවා හදන්නට මොන තරම් දුක්වින්දා ද කියලා දන්නේ දෙවියෝ පමණයි.'' පුතාට නින්ද යනතුරු උකුල උඩ පුතාගේ හිස පිරිමදිමින් සීපද කිව හැටි මට මතකයි දැන් පුතා ලොකු මිනිහෙක් වෙලානේ. ඒක නිසා අම්මාගේ අගය නොදන්නේ කියා විමලා සිතුවා ය.

දැන් නම් වේලාව හරියන්න ඕන. මං පුතාට නැවතත් කතා කරන්නට ඕනෑ කියා විමලා සිතුවා ය. එහෙත් ඇයගේ සිත සසල වෙමින් බිහගුළු ලෙස පුතා ළඟට ගියා ය. ''අනේ පුතේ මට බනින්න එපා. දැන් වේලාව කීයද?'' කියලා කියන්න කීවා ය. එවිට පෙරසේම බැණ වදිමින් දැන් රාත්‍රී 11 යි කියලා කීවේ ය. ආයේ නම් මේ පැත්තට එන්න එපා කියා තරයේම කියා සිටියේ ය.

එවිට අම්මා අත දිගු කරමින් දෙවියන් වැඳ පුතාගේ හිස පිරිමදිමින් මගේ පුතාට සුභම සුභ උපන් දිනයක් වේවායි මෛත්‍රී යහපත් කරුණාවෙන් යුක්තව කීවා ය. එවිට තම පුතා සහන් අනේ අම්මේ රත්තරං අම්මා රෑ නිදි මරාගෙන වේලවා ඇසුවේ මට උපන් දින සුභ පැතුම් කරන්නට ද?

15 පිටුවට...

මට උපන් දිනය මතක නැහැ අම්මේ. මගේ අම්මට මං කථා කරපු විදියට සමාව දෙන්න අම්මේ කියමින් මවගේ දෙපාමුල වැඳ වැටී සමාව අයද සිටියේ ය.

පුතේ නුඹලා වගේ නෙමෙයි අම්මා කෙනෙක් කියන්නේ දරුවන්ට නොදැනෙන වේදනාවක් කැක්කුමක් දරාගන්න පුලුවන් කෙනෙක්. ඒ නිසා මගේ පුතාට සමාව දෙනවා ඒවාගෙම බුදුසරණයි දෙවිපිහිට ප්‍රාර්ථනා කරනවා. පුතේ නුඹ ආවේගශීලි නොවී යහපත් කෙනෙක් වෙන්. මට කරන ගෞරවය එයයි. මව පැවසුයේ ස්නේහයෙන් යුතුව පුතු හිස අතගාමිනි.

-කේ.ආර්. ප්‍රනාන්දු-
(768)

---

# කොවිඩ් 19 වයිරසය එන්නතකින් සුවපත් කළ හැකිනම්?

2019 වසරේ දෙසැම්බර් මසයේ චීනයේ වූහාන් නගරයෙන් ආරම්භ වුණ කොවිඩ් 19 වයිරසය අද වන විට ලෝකයේ රටවල් 216 ක් පුරා ව්‍යාප්තව් ඇති වසංගතයක් බවට පත්වී ඇත. මෙම ලිපිය ලියන අවස්ථාව වනවිට ලෝකයේ කොවිඩ් ආසාදිතයින් සංඛ්‍යාව කෝටි 7 ඉක්මවන අතර මරණ සංඛ්‍යාව ලක්ෂ 16 ක් පමණ වෙයි. කොරෝනා වයිරසය පවුලට අයත් සාර්ස් වයිරසයේ කොවිඩ් 2 ලෙස මුලදී මෙය හැඳින්වුවද 2020.02.11 දින සිට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කොවිඩ් 19 (*Corona Virus Decease 19*) ලෙස ලේඛණගත කරන ලදී. මෙම රෝගකාරක වයිරසයේ ප්‍රධාන ලක්ෂණය නම් වයිරසය ආසාදනය වූ පුද්ගලයකු මගින් තවත් පුද්ගලයකුට රෝගය බෝවීම යි. වෙනත් වචනවලින ්කියන්නේ නම් රෝග වාහකයා මිනිසා ය. රෝග ලක්ෂණ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. මූලික රෝග ලක්ෂණ වන්නේ උණ, වියලි කැස්ස සහ හතිය යි. මීට අමතරව හිසරදය, උගුරේ සෙමගතිය, බඩයාම සහ කෑම අරුචිය, වමනය වැනි රෝග ලක්ෂණ දැකිය හැකිය. සාමාන්‍යයෙන් මෙම කාලසීමාව දින 17 ක් දක්වා කල්දී ඇත්තේ රෝග කාරකය සම්පූර්ණයෙන් ඉවත්ව ගොස් ඇතිබව නිශ්චිතව දැන ගැනිමට ය. මෙම මුල් දින 10 තුල රෝග තවත් පුද්ගලයෙකුට බෝවී වයිරසය ව්‍යාප්තවීමට පටන්ගන්නා අතර එමගින් රෝග ව්‍යාප්තිය ද ඉහල යයි. රෝගයේ භයානකම ලක්ෂණය වන්නේ එම සමහරුන්ට වැලදී තිබුණ ද මතුපිටින් කිසිදු රෝග ලක්ෂණයක් නොපෙන්වයි. කෙසේ වෙතත් එවැනි අයගෙන් ද තවත් අයෙකුට රෝගය බෝවිය හැකිය. විශේෂිත ලක්ෂණය වන්නේ පුද්ගල ඇසුර තුලින් සමාජය තුළ රෝගය වේගයෙන් පැතිර යාමයි. රටක සමස්ත ජනගහනයෙන් විශාල පිරිසක් රෝගීන් වුවහොත් එක් එක් රටවල ඇති. සෞඛ්‍ය පහසුකම් අනුව රෝහල්වලට දැරිය හැකි රෝගීන් ප්‍රමාණය තීරණය වේ. රෝහල් ධාරිතාව ඉක්මවා රෝගීන් වැඩිවීම රෝග පාලනයට සුබදායී ලක්ෂණයක් නොවේ.

ඉතා උසස් සෞඛ්‍ය පහසුකම් ඇති ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල පවා රෝහල් පසුකම් ප්‍රමාණය ඉක්මවා රෝගීන් ඉහල යාම නිසා මේ වන විට රෝගය පාලනය කිරීම අසීරු වි ඇත. එරට අදවන විට සිටින ආසාදිතයින් සංඛ්‍යාව කෝටි 1.64 ක් වන අතර මරණ සංඛ්‍යාව ලක්ෂ 3 ට ආසන්න ය. දෛනික ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 2 ද ඉක්මවා යයි. දෛනික සාමාන්‍ය මරණ සංඛ්‍යාව 2,000 ද ඉක්මවා යයි. දෙවන ස්ථානයේ පසුවන බ්‍රසීලයේ ආසාදිතයින් සංඛ්‍යාව ලක්ෂ 69 ක් වන අතර මරණ සංඛ්‍යාව ලක්ෂ 1.8 කි. අසල්වැසි ඉන්දියාවේ ආසාදිතයින් සංඛ්‍යාව ලක්ෂ 98 ක් වන අතර මරණ සංඛ්‍යාව ලක්ෂ 1.43 කි. ශ්‍රී ලංකාවේ ද ආසාදිතයින් සංඛ්‍යාව 32,000 ඉක්මවා ඇති අතර මරණ සංඛ්‍යාව 149 කි. (2021-02-05 සැඳෑව මුද්‍රණයට යන අවස්ථාවේ සමස්ත ගෝලීය ආසාධිතයන් 105,483,376 ද ගෝලීය මරණ 2,296,281 ද විය. ලංකාවේ සමස්ත ආසාධිතයන් 67451 ක් වූ අතර සමස්ත මරණ 339 ක් විය)

කොවිඩ් 19 ආසාදනයට වයස් ප්‍රභේදයක් නොමැති අතර සමීප ඇසුර පවත්වන සියලු දෙනාට රෝගය බෝවිය හැකිය. සාමාන්‍යයෙන් වයස්ගත පුද්ගලයනට රෝගය බෝවීමෙන් සංකූලතා ඇතිවීමට ඉඩ ඇත. එසේම අධි රුධිර පීඩනය, දියවැඩියාව සහ ඇදුම වැනි පෙනහලු වැනි ස්වසන ආශ්‍රිත රෝග  ඇති අයට රෝගය වැලදුනොත් සංකූලතා ඇතිවී මරණයට පවා පත්වේ.

16 පිටුවට...

ශරීරයේ ප්‍රතිශක්තිය හීන වීමෙන් රෝගය බලවත්වීම හේතුවෙන් මෙවැනි අයගේ මරණ අවදානම ඉතා ඉහල ය. එවැනි අය හැකිතාක් දුරට හුදෙකලාව සිටිමින් සමාජ සම්බන්ධතා දුරස්ව තබාගැනීම රෝගය වැලදීම වලක්වා ගැනීමට ඇති සුදුසුම ක්‍රමය යි.

මිනිසාගෙන් මිනිසාට පැතිරී යන මෙම වසංගතය යම් අයෙකුට ආසාදනය වී ඇතිදැයි දැනගන්නේ PCR පරීක්ෂණය මගින් ය. පරීක්ෂණයේ දී රෝගය වැලදී ඇතිබව අනාවරණය වුවොත් ප්‍රතිකාර සඳහා රෝහල්ගත කෙරේ. එසේම අදාල රෝගියාගේ ආශ්‍රිතයින් ලෙස හඳුනාගත් අය දින 14 ක නිරෝධායන කාලයකට යටත් කරනු ලැබේ. මෙම නිරෝධායන කාලසීමාව තුල රෝග ලක්ෂණ නොපෙන්වයි නම් ඔවුන් නිරෝගී ලෙස සලකන අතර රෝගී ලක්ෂණ ඇති අය රෝහල් ගත කෙරේ. තවද සෞඛ්‍ය අංශවල නිර්දේශය වන්නේ දින 14 ක නිරෝධායනයට අතිරේකව තවත් දින 14 ක ස්වයං නිරෝධායනයක් අවශ්‍ය බවයි. එමගින් රෝග ව්‍යාප්තියේ අවදානම අවම වන්නේ ය. කෙසේවෙතත් රෝගය වැලදුන අයෙකුට නැවත වැලදුන බවට ඉතා සුලු සිද්ධි සංඛ්‍යාවක් වාර්තා වී ඇත.
රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා සියලු දෙනා විසින් ම මුහුණු ආවරණ පැලදීම, පුද්ගල දුරස්ථභාවය රැකගැනීම සඳහා අවම වශයෙන් මීටරයක දුර පවත්වාගෙන යාම සහ නිතර නිතර විෂබීජ නාශකවලින් අත් සේදීම නිර්දේශකර ඇත. රෝගය සම්පූර්ණයෙන් මර්ධනය වනතුරු මෙම ක්‍රියාකාරකම් අනුගමනය කිරීමට ජනතාවට සිදුවනු ඇත. මෙයට අමතරව ප්‍රදේශයෙන් ප්‍රදේශයට සංචරණ සීමාවන් පැනවීම, විනෝද චාරිකා නැවැත්වීම, කාර්යාල කටයුතු ඉතා අවම සේවක සංඛ්‍යාවකින් පවත්වාගෙන යාම, මංගල අවමංගල කටයුතුවලට සහභාගීවන්නන් සීමාකිරීමට කටයුතු කරන අතර ඒ පිළිබඳ අධීක්ෂණයක් ද පවතී. අධ්‍යාපන සහ කාර්යාල කටයුතු ද සැලකිය යුතු ප්‍රමාණයක් මාර්ගගත ක්‍රමයට (*Online*) පවත්වාගෙන යයි. මේ අනුව සියලු සමාජ සම්බන්ධතා අක්‍රිය කිරීමට හෝ සීමාකිරීමට නියමකිරීම නිසා සියලු සමිති සමාගම්වල කටයුතුවලට සහ ආගමික කටයුතුවලට කෙටිකාලීනව බාධාවන තත්ත්වයක් පවතී.

කොවිඩ් 19 වයිරසය ආරම්භ වූ 2019 දෙසැම්බර් මාසයේ සිට මෙම වයිරසය මර්ධනයට සුදුසු එන්නතක් සොයා ගැනීමේ පර්යේෂණ කටයුතු නොකඩවා සිදුකරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට කොවිඩ් 19 මර්ධන එන්නත් කීපයක් ලොව ප්‍රමුඛ පෙනේ රටවල් කීපයක් විසින් හඳුන්වා දී ඇත. එනම්,

1- ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆයිසර් සහ ජර්මනියේ බයෝටෙක් සමාගම් එක්ව නිශ්පාදනය කරන ලද ෆයිසර් එන්නත. මෙය 95% ක සාර්ථකත්වයක් පෙන්නුම් කරයි.

2- ඇමෙරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදිත 95% ක සාර්ථකත්වයක් පෙන්නුම් කරන මොඩර්නා එන්නත.

3- එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සහ ඇස්ට්‍රාසෙනෙකා සමාගම එක්ම නිශ්පාදනය කල 62% - 90% ක සාර්ථකත්වයක් පෙන්නුම් කරන එන්නත.

4- රුසියාවේ ගැමලේයා ආයතනය නිෂ්පාදනය කල 92% ක සාර්ථකත්වයක් ඇති ස්පුට්නික් 5 එන්නත.

5- චිනයේ බයෝ පාමසියුටිකල් ආයතනය නිෂ්පාදනය කල සිනෝවැක්ස් එන්නත.

මේ සියලු එන්නත් වර්ග තවමත් පර්යේෂණ මට්ටමේ පවතින බැවින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය තවමත් ලැබී නොමැත. කෙසේ වෙතත් ෆයිසර් එන්නත එංගලන්තයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පුද්ගලයින් සඳහා එන්නත් ලබාදීම ආරම්භ කර ඇත්තේ ඒ ඒ රටවල සෞඛ්‍ය අංශවල නිර්දේශ මතය. මෙම එන්නත් වලින් අපේක්ෂා කරන්නේ වයිරසයට එරෙහිව ශරීරයේ ප්‍රතිශක්තියක් ඇති කිරීම යි. සෑම එන්නතකින්ම මාත්‍රා දෙකක් අවශ්‍ය වන අතර පළමු එන්නත ලබාදී දින 21කින් දෙවැන්න ලබාදීමට අපේක්ෂිතය. දෙවන එන්නත ලබාදුන්

17 පිටුවට...

අවස්ථාවේ සිට වයිරසයට එරෙහිව පුද්ගලයාගේ ප්‍රතිශක්තිය ඇතිවන බව වෛද්‍ය මතය යි. රෝගය සම්පූර්ණයෙන් මර්ධනය කිරීමට අනුමත වූ එන්නත් අවශ්‍ය වන අතර එම ක්‍රියාවලිය ආරම්භවීමට තවත් මාස කීපයක් ගතවනු ඇත. දැනටමත් ලොව බලගතු රටවල් අනුමත එන්නත් විශාල ප්‍රමාණයකින් ලබාගැනීමට යෝජිත ය. අනිකුත් රටවලට අවශ්‍ය එන්නත් ලබාදීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ මැදිහත්වීමෙන් සපයාදීමට බලාපොරොත්තු වේ. එන්නත මගින් කොවිඩ් 19 ලෝකයේ සදහටම තුරන් වී සියලු දෙනාම නිරෝගී දිවියක් ගතකරනු දැකීම අප කාගේත් බලාපොරොත්තුව යි.

එම්.ඩී. සෝමවීර
(0718148831)

# සරුංගලය

චූටි දුවගෙන පිම්මේ ගියේ උපුල් අයියගේ ගෙදර. මේ ගෙවල් දෙක තිබුණේ පෙනෙන තෙක් මානයක. චූටි මිදුලේ ඉන්න විට උපුල් අයියට පේනවා. උපුල් අයියා මිදුලේ ඉන්න විට චූටිට පේනවා.

''මොකෝ කෙල්ලේ මේ හති දාගෙන?''

''උපුල් අයියා ඉන්නව ද නැන්දේ?''

''දැන් ටිකකට ඉස්සෙල්ලා හිටියා. කොහෙට හරි වෙලා ඇති. වත්ත පහළ ද දන්නේ නෑ.''

''අර මේ සරුංගලයක් හදනවයි කීවනේ අයියා.''

''උඹට ඉතින් සරුංගල් සිහියමනේ තියෙන්නේ. පුංචි කාලේ අපිත් ඔහොම තමයි. වැලිබත් උයනවා, කෝම්පිට්ටු හදනවා, පල්ලෙහා වෙළේ නියරවල් වල වැටි වැටී දුවනවා.''

වෙල් යාය හරහා හමා එන සුළං රැළි නිසා මිදුල අවට තුරුලතා අතු ඉති නැමී නැමී පවන් සලයි. ලේනෙක් අත්තෙන් අත්තට පනිමින් ටිං ටිං හඬ නංවමින් අත්තෙන් අත්තට පනිමින් දුවමින් සිටියි.

''අර එන්නේ උපුල් අයියා.''

''චූටි උපුල් අයියා එන දෙසට වේගයෙන් දුවයි.''

''මොනවද අයියේ මේ සිලි බෑග් එකේ?''

''ඒකේ තියනවා ලස්සන දෙයක්''

''අනේ දෙන්න බලන්න.''

''චූටිට හොඳ නෑ නොවැ ඒවා.''

''හරි නරකයි අයියා. මං තරහම තරහයි.''

''චූටිට හිතෙන්නේ මොනවා කියල ද?

''කන දෙයක් නේ ද?''

''මෙන්න දැක්ක ද?''

18 පිටුවට...

''ආනේ වෙරළු නේ ද? දෙන්න දෙන්න.''

''චූටිට වෙරළු කීයක් ඕන ද?''

''අයියටයි, මටයි, නංගිටයි ගෙඩි පහ ගාණේ දෙන්න.''

''උපුල් අයියා සරුංගලේ අද හදනවා කිව්වා නේ ද?''

''බට ලී ගේන්න පන්සල් වත්තට යන්න එපායැ. මේ වෙලාවට හාමුදුරුවෝ නැතුව ඇති. අපි හෙට උදේට යමු.''

පන්සල පිහිටි ඉඩම අයිනෙන් වැටී ඇති නියර උඩින් තමයි ගුරු පාරට යන්න තියෙන්නේ. පන්සල් වත්ත අයිනෙන් නියර මැදින් ගලා බස්නා ඇල මාර්ගයක් ඇත. ඇල මඟින් ගලාගෙන යන ජලය පහල වෙල් යාය සරුසාර කරයි. සරුවට වැඩි ගිය නිල්වන් ගොයම දැකීමත් සිතට ඇති කරන්නේ ඉමහත් ආශ්වාද ජනක හැඟීමකි. රන්වන් ගොයම් කරල් පැසෙන කාලයට හරිම සුන්දර ආශ්වාදයක් සිත් තුළ ඇති කරයි.

කුඹුර හරහා හමා එන සුළඟ සිතට ඇති කරන්නේ ඉමහත් ආශ්වාදයක් ය. ගමේ ළමයින් පාසැල කරා ගමන් ගන්නේ මෙම කුඹුර හරහා වැටී ඇති නියර උඩින් ය. ඇල ඉවුර වැවී ඇති සරුසාර බට ගස් නිසා අවට පරිසරය වඩාත් සිත් සතන් තුළ සුන්දරත්වයක් ඇති කරලයි. නොයෙක් පාටින් යුත් ලස්සන සමනලුන් හාත්පස අලංකාර කරයි.

මාස දෙකකට වරක් උපුල් සහ අම්මා විසින් පන්සලට දානය රැගෙන යාම පුරුද්දකි. උපුල් පන්සල වෙත දානය ගෙනයාමට දැඩි කැමැත්තක් දක්වයි. හේතුව උපුල් හොඳ දරුවෙක් බව ලොකු ස්වාමීන් වහන්සේ කියා ඇති නිසාය.

අප පොහෝ දිනවලදී පන්සල වෙත යාම පුරුද්දක් කර තිබිණි. මල් පහන් පූජා කිරීමෙන් පසු ලොකු හාමුදුරුවන් දැකීමට ද යන්නෙමු. උන්වහන්සේට අප් වන්දනා කරන්නෙමු. උන්වහන්සේ තුළ තිබු මහා කරුණා ගුණය නිසා අප සමඟ සුහචව සුළු වේලාවක් කතා කරයි.

''උපුල් අයියා.''

ඒ චූටිගේ කටහඬ ය.

''බට ලී ගේන්න යමු ද?''

''හා යමු යමු.''

''අර ඉන්නේ පොඩි හාමුදුරුවෝ''

''ආ උපුල් මේ චූටිත් එක්ක මොකෝ මේ පැත්තේ?''

''චූටිට සරුංගලයක් ඕනැයි කියනවා.''

''ඉතින්''

''බට ලි දෙකක් කපා ගන්නයි ආවේ.''

''පරිස්සමෙන් කපා ගනිල්ලා. තණකොල ගොඩක් වැවුණ තැන් වලට යන්න එපා. සත්තු ඇති.''

''එහෙමයි හාමුදුරුවනේ.''

19 පිටුවට...

''චූටි එහෙම නෙමේ අනේ ඔය පාප්ප කොළේ තැවරිලා කොළේ ඉරිලා යනවනේ ඔහොම අලවන කොට.''

''මං සරුංගලේ උඩ කොටුවෙන් අල්ලාගෙන ඉන්නම්.''

''හරි මං අලවනකං ඔහොම අල්ලාගෙන ඉන්න.''

''හරි මම අල්ලාගෙන ඉන්නම්.''

අඩි හතරක් තරම් උස ඇති මේ සරුංගලය කොල ඇලවීමෙන් පසු විශාල ලෙසට පෙනෙනු ඇත. කොළයෙන් කපන ලද රැල් ඇලවීමෙන් පසු තවත් විශාල වී පෙනෙනු ඇත. චූටිව වසා තැබිය හැකි තරමට විශාල පෙනුමක් ඇතිවනු නොඅනුමාන යි.

''අපි හවස හතරට විතර යමු සරුංගලයත් අරගෙන වෙත පැත්තට.''

''හරි හරි හතරට දුවමු වෙලට.''

චූටි හඬ නගා කිය යි. මහ හඬින් සිනාසෙමින් නටයි. චූටි තමන්ගේ නිවස වෙත දුවයි.

''අම්මේ උපුල් අයියත් එක්ක අපි සරුංගලයක් හැදුවා.''

''ඉතින්''

''හරි ලස්සනයි. ලොකුයි. මටත් වැඩි ලොකුයි.''

''හැබෑට දෙවියනේ''

''අපි අද හවසට සරුංගලේ අරගෙන වෙල හරහා දුවගෙන දුවගෙන යනවා.''

''කරුවල වැටෙන කන් වෙලට වෙලා ඉන්නවා හෙම නෙමේ. තේරුණා ද?''

''හරි හරි තේරුණා.''

පැසී තිබුණ ගොයම දැන් සම්පූර්ණයෙන් කපා ඉවත් කර ඇත. ගොයම් කපාගත් පසු ඉතිරි ඉපනැල්ල වෙල් යාය පුරා දිස් වේ. මේ නිසා කුඹුරු යාය හිස් පාළු ස්වභාවයක් මතු කරල යි. ගොයම් ගසින් පිරී පවතින විට දැනෙන සිරියාව සිඳී ගොස් ඇත. සුළං රැල්ලෙන් මතුවන සිලි සිලි හඬ නැත.

''ඉපනැල්ල නිසා කකුල් රිදෙනවා නේ ද චූටි?''

''ඔව් එත් ඒක දැනෙන්නනේ නෑ සරුංගලේ දිහාව බලනකොට.''

''ඔව් සරුංගලය අතේ තියෙනකොට හරි සිරියාවයි.''

''නූල් පන්දුව බිම වැටුන චූටි ඒක අතේ තියාගන්න.''

''චූටි දුවගෙන ගොස් නූල් පන්දුව රැගෙන අත් දෙකෙන් තදට අල්ලා ගත්තා ය.''

''අයියා දුවමු ද?''

''නෑ නෑ ඔහොම යමු.''

20 පිටුවට...

''උණා පදුර ළඟට ද යන්නේ අයියා?''

''ඔව් එතන හොඳයි. හෙවණයි.''

''අර ගල් ගෙඩි දෙක තුනක් තියෙන්නේ අපට ඉඳ ගන්න.''

''ආනේ සරුංගලේ පැද්දෙමින් ඉහළට නගිනවා.''

''අද හොඳට හුළං තියෙනවා ඉක්මණින් උඩට යනවා.''

''රවුන් රවුන් කැරකි කැරකි උඩට යනවා.''

''ආනේ හරි ලස්සනයි උපුල් අයියා.''

''ඔව් ඔව් දැන් කුඩාවට නේද පේන්නේ?''

''නූලත් ඉවර වෙන්න ළඟයි නේද උපුල් අයියේ?''

''අද හුළං හමනවානේ ඉක්මණින් උඩට ගියා.''

ඉරත් බැස යමින් පවතී. ඉර අව්ව රතු පාටින් බබළයි. බැස යන හිරුගේ දුබල රැස් උණා පඳුර ඉදිරියේ පෙනෙයි.

තණ කමින් සිටි හරකුන් ද දැන් දැන් නිවෙස් බලා ඇදෙමින් සිටියි. අඳුර පැතිරෙන ලකුණු හැම තැන. තණකොල කපා ගත් උක්කු අයියා අප දෙස බලා සිනාසිණි.

''ළමයිනේ රෑ බෝ වෙන්න ළඟයි.''

ඔහු තණකොළ ගෝනිය හිස මත තබාගෙන ඈතට ඈතට යයි.

''චූටි චූටි අයියෝ සරුංගලේ ගියා.''

''සරුංගලේ ගියා.''

''ඔව් නූල කැඩිලා ගියා අර ඈතට ඈතට යනවා.''

චූටි හඬ නගා අඬයි. ඉකි ගස ගසා හඬයි.

''අඬන්න එපා චූටි හෙට ඔයාට ලස්සන සරුංගලයක් හදලා දෙන්නම්.''

චූටිගේ ඉකි ගැසුම නිවස වෙත යන තෙක්ම පැවතිණි.

-ආර්.පී.ඒ. ගුණසේකර-
දු.ක. 0332224662
ජ.දු. 0717062114

සැ.යු : පසුගිය සැඳෑව කලාපයේ කුමාරි නාගරනායක මහත්මියගේ නමින් පලවූ ''ඔබගේ සිරුරේ සීනි කොලොස්ටරෝල් පලවා හරින්න'' යන ශාස්ත්‍රීය ලිපියේ එය මෙත්සවිය නම් සඟරාවෙන් උපුටා ගැනුනු බව සඳහන් කිරීමට අතපසු වීම ගැන ඔබගේ කමාව අයදිමු.

-සංස්කාරක-

# ඔබ ධනවතෙක් ද? දුප්පතෙක් ද?

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ''ඉණ සූත්‍ර'' දේශනාවෙන් පැහැදිලි කර දීලා තියෙනවා පුද්ගලයෙක් දිළින්දෙක් වෙන්නේ කොහොමද? ධනවතෙක් වෙන්නේ කොහොමද? කියා. පාලි භාෂාවෙන් ''ඉණ'' කියන්නේ ණය ගැනීමටයි.

මෙම සූත්‍රය තුළින් පෙන්වා දී ඇති ශ්‍රද්ධාව, හිරි, ඔත්තප්ප, වීරිය, ප්‍රඥාව, යන කරුණු පහ පුද්ගලයෙකු නිවැරදිව ප්‍රගුණ කරන්නේ නම් එම පුද්ගලයාට මිළ මුදල්, යාන වාහන, දේපළ වස්තුව නොමැති වුවත් ඔහු ධනවතෙක් බව බුදුරදුන් පෙන්වා දී ඇත.

ශ්‍රද්ධාව කියන්නේ කුමක්ද? බුදුන් වහන්සේගේ සම්මා සම්බුද්ධත්වය, බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ පිළිබඳව ඇතිකර ගනු ලබන විශ්වාසය ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව නොමැතිවීම තම තමන්ගේ ජීවිත වලට විශාල පාඩුවකි. ශ්‍රද්ධාව නොමැති නිසා සමහරු බුදුන් අවිශ්වාස කරති. මෙලොව පරලොව විශ්වාස නොකරති. තමන්ගේ ක්‍රියාවට තමන් වගකිය යුතු බව බුදුරදුන්ගේ දේශනාවයි.

ශ්‍රද්ධාව නොමැති විට දෙවන කරුණ වූ හිරි (පව් වලට ලැජ්ජාව නැතිබව) වැඩි වේ. සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය, ආදී පස් පව් මෙම පුද්ගලයා අතින් කිසිදු ලැජ්ජාවක් නැතිව නිරායාසයෙන් සිදුවේ. එසේම දස අකුසල්ද කිසිදු ලැජ්ජාවක් නැතිව සිදුවේ. බුදුරදුන් මෙම සූත්‍රයෙන් පෙන්වා දෙනවා සිත, කය වචනය යන තිදොරින්ම අකුසල් කිරීම සිදුවන්නේ ශ්‍රද්ධාව නැති කමින් සහ ලැජ්ජාව නොමැතිකමිනි. එසේම අකුසල් කිරීමට බය නොමැති වීමත් පිරිහීමේ ලක්ෂණයකි. බුදු දහමට අනුව, දුගී වීමට හේතු කාරණයකි. මරණයෙන් පසු සතර අපායට යෑමටද සිදුවේ.

හතරවන කාරණය වීර්යයයි. වීරිය ඇති වීමට පුද්ගල චරිතය තුළ සිහිය තිබිය යුතු අතරම සද්ධර්මය ශ්‍රවණය කර තිබිය යුතුය. මේ තත්වයෙන් හෙබි පුද්ගලයාට යම් අකුසලයක් සිදුකරන්න චේතනාවෙන් පහල වන විටම එහි ඇති භයානක ප්‍රතිඵලය සිහියට නැගෙනවා. ඒ නිසාම ඒ සිතුවිලි දුරුකරගන්නවා. අකුසල් සිදුකළහොත් පිරිහීම පිරිහීම තමයි ඇතිවන්නේ කියලා අවබෝධ වෙනවා. එබැවින් පුද්ගලයෙකු යහපත් වීමට පොහොසතෙකු වීමට සිහිය දියුණු කර ගැනීම හා සද්ධර්මය ශ්‍රවණය තුළින් වීර්යය වැඩිය යුතු බව පෙන්වා දෙන ලදී.

පස්වන කාරණය ප්‍රඥාව, ප්‍රඥාව නැතිනම් එම පුද්ගලයා චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගැනීම පිණිස නුවණ මෙහෙයවන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ මේ ඉණ සූත්‍රයේදී මෙම පුද්ගලයින් හැඳින්වූයේ දිළින්දන් ලෙසිනි. මේ දිළිඳුකම නිසාම එම පුද්ගලයෝ නිතරම කයින් වැරදි කරනවා. වචනයෙන් වැරදි කරනවා, සිතින් වැරදි කරනවා.

බුදුරජාණන්වහන්සේ මේ ඉණ සූත්‍රයෙන් වදාළේ යම් පුද්ගලයෙක් මේ ආකාරයට කයින්, වචනයෙන්, මනසින් වැරදි කරයිද ඒ පුද්ගලයා ණය ගැනීමට හසුවන බවයි. යමෙක් ණයක් ලබාගත් විට ඒ සඳහා පොළිය එකතු වේ. එම ණය මුදල පිළිවෙලට නොගෙවීම නිසා ණය බරින් තව තවත් පීඩාවට පත් වී දුගී බව තීව්‍ර වේ. විනාශයට පත්වේ. යම් පුද්ගලයෙක් තුළ ශ්‍රද්ධාව නැත්නම්, පව් කිරීමට ලැජ්ජාව නැත්නම්, පව් කිරීමට භය නැත්නම්, පව් වලින් නිදහස් වෙන්න වීරිය නැත්නම්, ප්‍රඥාව දියුණු කරගන්නේ නැත්නම්, එම පුද්ගලයාගේ ජීවිතය ඉතාමත් දිළිඳු තත්වයට පත්වන බව පෙන්වා දී ඇත.

එබැවින් බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් හඳුනා ගැනීම තුළින් ශ්‍රද්ධාව දියුණු කරගත යුතුය. ශ්‍රද්ධාව නැතිව ගියාම පුද්ගලයෙකු තුළ ලැජ්ජාව නැති වෙනවා. ලැජ්ජාව නැතිකමින් පව් කිරීමට ඇති බය නැති වෙනවා. ඒ නිසාම මේ පව් වලින් නිදහස් වෙන්න වීරිය, උත්සාහය ඒ පිළිබඳව මනස මෙහෙයවන්න පෙළඹවීමක් නැතිවෙනවා. මෙම පුද්ගලයා සිත දියුණු කර නොගැනීම නිසා ජීවිතේ ඉතාම දුප්පතෙකු ලෙස ජීවත් වෙන බව බුදුරජාණන් වහන්සේ මේ ''ඉණ'' සූත්‍රයෙන් පෙන්වා දී තිබෙනවා.

22 පිටුවට...

මෝහය හෙවත් මුලාව පුද්ගලයා බොහෝ සෙයින් පරිහානියට පත් කිරීමට සමත් බව මේ සූත්‍රයෙන් පෙන්වයි. වැරදි දැකීම හෙවත් මිච්ඡා දිට්ඨිය හේතු කොට ගනිමින් නිවැරදි දේ වැරදි ලෙසත්, වැරදි දේ නිවැරදි ලෙසත් ග්‍රහණය කරගනිමින් විෂමචරියාවලින් යුක්තවීමට පුද්ගලයා පෙළඹේ. ධර්මයෙහි නිරන්තරව උගන්වනු ලබන්නේ අසාරවත් දෙයින් සාරවත් දෙය වෙන් කරගෙන නිරන්තරවම සාරවත් කටයුතුවල නිරතවන ලෙසයි. සසරේ ගමන නතර කිරීමට බුදුරජාණන් වහන්සේ දෙසූ නිර්මල ගැඹුරු ධර්මය අවබෝධ වී පංචස්කන්ධයේ ඇති අනිත්‍ය දුඛ්‍ය අනාත්මය දැකීමට ශක්තිය ලැබේවා ! සැම කෙනෙක්ම ධර්මයට අනුව පොහොසතෙක්ම වේවා !

තෙරුවන් සරණයි !

එස්.එස්. විමලසේන
''ප්‍රියන්කර'' ඉහළ නාරගල, ගෝමින්න

# මහ බැංකු අධිපතිතුමා සමඟ සාකච්ඡාව

2021 ජනවාරි මස 31 වෙනි දින පැවති පිං පැමිණවීමේ උත්සවයෙන් අනතුරුව මහ බැංකු අධිපතිතුමා හමුවී සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලද අතර, සභාපති ජයලාල් ජයවර්ධන මහතා ලේකම් : ආරියදාස තන්ත්‍රීගේ මහතා ශ්‍රදාණා රණතුංග මහත්මිය හා එම්. මඩිගසේකර මහතාද ඒ සඳහා සහභාගී විය. එහිදී මහ බැංකු විශ්‍රාමිකයන් හා යැපෙන්නන් වෙනුවෙන් ද PCR පරීක්ෂණ කිරීමේදී වැයවන මුදල් ප්‍රතිපූරණය කරන මෙන් ඉල්ලා සිටීම හා මහ බැංකු අවමංගල්‍යය සහනාධාර අරමුදල සම්බන්ධයෙන් මේ වන විට පැන නැගී ඇති ගැටලු නිරාකරණය කර යැපෙන්නන්ට අදාළ ගෙවීම් කටයුතු කිරීමට සුදුසු පසුබිමක් ඇතිකිරීම හා 2021 වර්ෂයට නියමිත විශ්‍රාම වැටුප් වැඩි කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමේදී 2015 වර්ෂයට විශ්‍රාමික වැටුප් යාවත්කාලීන කරන මෙන් මෙයට පූර්වයෙන් ඉල්ලා තිබූ යෝජනාවම තවදුරටත් ඉදිරිපත් කරන බවද මෙම කෙටි පිළිසඳරේ දී එතුමාගේ අවධානයට යොමුකළ අතර, ඒ පිළිබඳව වැඩිමනත් විස්තර ලිඛිතව එතුමා වෙත ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව ඉක්මනින්ම එය ලබාදීමට කටයුතු කරන බවත් සාමාජිකත්වය වෙත කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමු.

**-විධායක කමිටුව-**

# පිං පැමිණවීමක්...

1996 ජනවාරි මස 31 දින පෙ.ව. 10.49 පැයට මහ බැංකුවට එල්ලවූ බෝම්බ ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත්වූ හිතවතුනට පිං පැමිණවීමටත් විවිධ රෝගාබාධා වලට ලක්ව මේ දක්වා කායික මානසික පීඩාවන්ට පත්ව සිටින හිතවතුනට සෙත් පැතීමටත් විශ්‍රාමික සොයුරු සොයුරියන්ගේ දායකත්වයෙන් පිං පැමිණවීමේ උත්සවයක් 2021 පෙබරවාරි මස 01 දින පස්වරුවේ නුගේගොඩ විජේරාම පඤ්ඤාදයාරාම මහ පිරිවෙනෙහි දී පවත්වන ලදි. රුපියල් දෙලක්ෂයකට ආසන්න මුදලක් වැයකර එහි වැඩ වාසය කරන ස්වාමීන් වහන්සේලා අසූ හතර නමක් වෙනුවෙන් අවැසි පොත් පත් පෑන් පැන්සල් සෙරෙප්පු ආදියද සංඝාවාසයේ මුළුතැන්ගෙට අවැසිව තිබූ විදුලියෙන් ක්‍රියාත්මක වන පොල් ගෑමේ මැෂිමක් ද වියලි ආහාර ද්‍රව්‍ය හා විදුලි පහන් ආදී අවැසිව තිබූ සියලුම දෑ ලබා දෙන ලදි. එහිදී දානානිසංස සම්බන්ධයෙන් වැදගත් ධර්ම කරුණු අළලා සිදුකරන ලද සාරගර්භ පුණ්‍යානුමෝදනාව විචිත්‍ර ධර්ම කථික මඩිහේ සුගතසිරි හිමිපාණන් විසින් පවත්වන ලද අතර ශාසනයේ චිර ජීවනය පතා සිදු කරන ලද මෙම පින්කමට සහභාගී වූ සැදැහැවතුන් සියලු දෙනාටම හා ඒ සඳහා බරපැන දරමින් දායකත්වය දැක්වූ සැමට ද නිරෝගී සුවය හා මෙවන් කටයුතු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා යි ද ප්‍රාර්ථනය කළහ. ඔබ සැමට තෙරුවන් සරණයි !

(මෙයට අදාළ ඡායාරූප කිහිපයක් 11 පිටුවේ පළකර ඇත)

# මතක සුවඳ පමණක් ඉතිරි කර සදහට ම අපෙන් සමුගත් සහෘදයන්...

01. නොයෙල් රණසිංහ මහතා (P/449)
02. කාර්මන් සිරිවර්ධන මහත්මිය (P/450)
03. ඇන්තනී එදිරිසිංහ මහතා (P/487)
04. ෂර්වා ජයසූරිය මහත්මිය (P/655)
05. පැට් නෙල්සන් මහත්මිය (P/982)
06. ඒ. සේනාරත්න මහතා (P/1014)
07. ඒ.ඒ.ඩී. සෙනරත් මහතා (P/1025)
08. ආර්. කුමාරසිරි මහතා (P/485)
09. ඩබ්.බී. නිහාල් පෙරේරා මහතා (P/617)
10. චන්ද්‍රසේන වෙදගේ මහතා (P/3005)
11. ආර්. මාලිමගේ මහත්මිය (P/3140)
12. එස්.එන්.ආර්. සේරසිංහ මහතා (P/3370)
13. එච්.පී.ටී. ජිනදාස මහතා (P/3611)
14. ජී.සී.ඩබ්. සිල්වා මහතා (P/3315)
15. එස්.ඩී. හැරිසන් මහතා (P/3373)
16. ජේ.පී.සී. ප්‍රනාන්දු (P/165)

## විරු සැමරුම

1996 ජනවාරි 31 දින ත්‍රස්තවාදින්ගේ කුරිරු බෝම්බ ප්‍රහාරයෙන් මියගිය සහෘදයන් සිහිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ විරු සමරුව ඉදිරිපිට පුෂ්පෝපහාරයන් පවත්වා, ඔවුන් සිහි කිරීමේ චාම් උත්සවයක් මෙවර පැවැත්විනි.

පවත්නා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අදාළ සෞඛ්‍ය නීති-රීතිවලට අනුකූලව එය පැවැත්වුණු අතර මහ බැංකුවේ ඉහළ කළමනාකාරීත්වය හා පැමිණ සිටි සේවක මඩුල්ල විශ්‍රාමිකයින්ගේ සංගම්වල ආරාධිත නිලධාරීන්ද එයට සහභාගී වූහ. මහ බැංකු විශ්‍රාමික සංගමයේ නිලධාරීන්ද දානමය කටයුතු වලටද සහභාගී වීමෙන් අනතුරුව පිං පමුණුවා අකල්හි මියගිය හිතවතුනට නිවන් සුව ප්‍රාර්ථනය කළහ.

**විධායක කමිටුව**









- කොරෝනා වසංගතය නිසා ඇතිවූ අසීරු තත්ත්වයන් මත පසුගිය 'සැඳෑව' කලාපයන් 2 ක් නිකුත් කිරීමට පමාවූ බව කරුණාවෙන් සලකන්න.
- ඔබට දැනගැනීම සඳහා අවශ්‍ය වන විශේෂ කරුණු හෝ ඔබට දැන්වීමට ඇති විශේෂ තොරතුරු පිළිබඳව දැනගැනීමට අමතන්න.
- **ලේකම් : ආරියදාස තන්ත්‍රීගේ මහතා 104/8, කුරේ පෙදෙස පෙදෙස, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**
- ඊළඟ 'සැඳෑව' කලාපයට ඔබේ නිර්මාණ ඉහත සඳහන් ලේකම්වරයාගේ ලිපිනයට යොමු කරන්න.

සැඳෑව

சந்தாவ

වෙබ් අඩවිය : www.sendewa.org

අංක : QD/50/News/2021 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.

**ගරු ලේකම්,**
**ආරියදාස තන්ත්‍රීගේ මහතා**
**104/8, කුරේ පෙදෙස පෙදෙස,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**

Typesetting - Hiru Creations - Moratuwa
hirucreations01@gmail.com